# 2022

# කාර්ය සාධන වාර්තාව

# சாதனைகள் அறிக்கை

# Performance Report




**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

கலாசார அலுவல்கள் திணைக்களம்

**Department of Cultural Affairs**

**8 වන මහල සෙත්සිරිපාය බත්තරමුල්ල** 8ஆம் மாடி, செத்சிறிபாய, பத்தரமுல்ல. 8th floor,Sethsiripaya, Battaramulla

# කාර්යසාධන වාර්තාව 2022

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ව්‍යුහය සහ දෙපාර්තමේන්තුව විසින්
2022 වර්ෂය තුළ සිදුකළ වැඩසටහන්, මෙහෙයුම් ක්‍රියාකාරකම් සහ ප්‍රගතිය සම්බන්ධයෙන් වන
මෙම සංක්ෂිප්ත සටහන සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ
සංවර්ධන හා සැලසුම් අංශය විසින් සම්පාදනය කරන ලදි.

**ප්‍රකාශනය**
සංවර්ධන හා සැලසුම් අංශය
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
8 වන මහල සෙත්සිරිපාය
බත්තරමුල්ල

**මාර්ගෝපදේශකත්වය**
ගරු විදුර වික්‍රමනායක
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය

**උපදේශකත්වය**
සෝමරත්න විදානපතිරණ
ලේකම්
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

**අනුශාසකත්වය හා අධීක්ෂණය**
භාග්‍ය සී කටුදෙණිය
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ (වැ.බ)

**මෙහෙයවීම**
ඊ. ඒ. පී. ප්‍රසාද් චන්දන
සහකාර අධ්‍යක්ෂ - සංවර්ධන හා සැලසුම්

**තොරතුරු සම්බන්ධීකරණය, සෝදුපත් කියවීම හා පරිගණක අක්ෂර සංයෝජනය**
කුමුදු පෙරේරා (අංශ ප්‍රධානී සංවර්ධන හා සැලසුම්)
නදීශානි අනුසරී (රාජ්‍ය කළමණාකරණ සහකාර)

**විශේෂ ස්තුතිය**
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ සියලුම සහකාර අධ්‍යක්ෂවරුන් ගණකාධිකාරී ඇතුලු කාර්ය මණ්ඩල සාමාජිකයන්ට සහ අනුබද්ධ ආයතනයන්හි ආයතන ප්‍රධානීන් සහ කාර්ය මණ්ඩලයන්ට

**පිටකවර නිර්මාණය, පිටු සැකසුම හා**
**පරිගණක ග්‍රාෆික නිර්මාණකරණය**
අයි. සමිත පෙරේරා (සංස්කෘතික නිලධාරී)

**භාෂා පරිවර්තනය**
ශානිකා සමරසේකර (භාෂා පරිවර්තක)
ඒස්. තනුෂාන්ත් (සංවර්ධන නිලධාරී)
ඒස්. ශිවනේෂන් (කාර්යාල කාර්ය සහායක)

**මුද්‍රණය**

සංවර්ධන හා සැලසුම් අංශය
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
8 වන මහල සෙත්සිරිපාය
බත්තරමුල්ල

**අභියෝග හමුවේ සිදුකළ**
**සංස්කෘතික සහ කලා ක්ෂේත්‍රයේ මෙහෙවර**



සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2022 වසරේ සිදුකළ කාර්යාවලිය සතුටුදායක තත්ත්වයක ඇතැයි විශ්වාස කරමි. විවිධ ගැටලු රැසක් පැන නැගී තිබූ වසරක සංස්කෘතිය විෂයෙහි සිදුකළ හැකි කාර්යයන් ද අතිශය සීමිත වූවාක් මෙන්ම පැවති ආර්ථික තත්ත්වය හමුවේ වියදම් සීමා කිරීම ද සමාජ ගැටලු හා විරෝධතා මධ්‍යයේ පොදු කාර්යය කළ නොහැකි තත්ත්වයක් හමුවේ ද ප්‍රතිපාදන ලබා ගැනීමේ දුෂ්කරතා හමුවේද එම තත්ත්වයට මුහුණ දෙමින් ලබාගත් අවම සම්පත් හා ප්‍රතිපාදන මධ්‍යයේ සිදුකළ කාර්ය සමුදාය සුවිශේෂය.

සමාජමය තත්ත්වය කෙබදු වුවද අත්‍යාවශ්‍ය කාර්ය සිදුකරමින් සමස්තයක් වශයෙන් පවත්නා තත්ත්වය රැක ගැනීමට අපවිසින් යත්න දැරුවෙමු. මෙහිලා අපගේ කාර්ය භාරය මෙන්ම අප ලත් ප්‍රගතිය 2022 වසරේ උසස් තත්ත්වයක පවත්වාගැනීමට හැකිවීම සතුටට කරුණකි. මේ සඳහා බුද්ධශාසන සංස්කෘතික හා ආගමික කටයුතු ගරු අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිඳුන්ගේ මග පෙන්වීම ද අමාත්‍යාංශ ලේකම් මහාචාර්ය කපිල ගුණවර්ධන මැතිතුමාගේ සහ සෝමරත්න විද්‍යානපතිරණ මැතිතුමාගේ උපදේශකත්වයද ගෞරවයෙන් සිහිපත් කරමි.

පැවති අභියෝගාත්මක කාල පරිච්ඡේදයක් තුළ අප විසින් ලබාගත් ප්‍රගතිය සුවිශේෂය. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට අනුයුක්තව සිටින අප නිලධාරීන් හරහා අගහිඟ කලාකරු දිමනා, වෛද්‍යාධාර හා මරණාධාර ලබාදීම අඛණ්ඩව සිදුවිය. සමස්තයක් වශයෙන් සුබසාධන කාර්යයන් කිසිදු අවහිරතාවක් නොවන පරිදි ජයගත හැකි විය. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට අනුයුක්ත අප නිලධාරීන් පැවති කොරෝනා වසංගත තත්ත්වයේදී සමස්ත රාජ්‍ය තන්ත්‍රයේ ක්‍රියාකාරීත්වයට සුවිශේෂ දායකත්වයක් ලබාදීම ද මෙහිලා සිහිපත් කරමි.

එමෙන්ම නව වැඩසටහන් රැසක් දියත් කිරීමට හැකියාව ලැබීම ද සුවිශේෂත්වයක් ගනී. දිවයිනේ ප්‍රථම කෙටි චිත්‍රපට සම්මාන උළෙළ සිදුකරන්නට ලැබීම මෙහිලා සිදුකළ හැකිවූ ජයග්‍රහනයකි. රජයක් වශයෙන් එතෙක් අවධානය යොමු නොවුනු කෙටි චිත්‍රපට ක්ෂේත්‍රයේ නිරත කලාකරුවන් රැසක් එහි ප්‍රතිලාභීන් බවට පත්කිරීමට ඒ අනුව හැකියාව ලැබිණ. එසේම රාජ්‍ය නර්තන කණ්ඩායමට සහ සංගීත කණ්ඩායමට නවක ශිල්පීන් බඳවා ගැනීමත් සමග ඔවුන්ගේ දක්ෂතා එළිදැක්වීමට සහ ශ්‍රී ලාංකේය සංගීත හා නර්තන කලාව ජාත්‍යන්තරයට ගෙන යමින් සංචාරක කර්මාන්තයට දායකත්වයක් ලබාදීමේ ඉදිරි පියවර තැබීමට හුස්මක් ප්‍රසංගය මගින් හැකියාව ලැබිණ. ඉතා අවම සම්පත් මගින් සිදුකළ මෙම කාර්යයන් මනාව සාක්ෂාත් කර ගැනීමට හැකියාව ලැබීම ද ඒ සම්බන්ධයෙන් හිටපු සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ තරණි අනෝජා ගමගේ මහත්මියගේ කැපවීමත් නියෝජ්‍ය අධ්‍යක්ෂ ෂාමිලා ක්‍රිශාන්ති මහත්මිය ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය දැක්වූ සහාය ඉතා අගය කොට සලකමි.

මෙවන් තත්ත්වයක ක්‍රියාවට නැංවූ අපගේ ප්‍රගතිය සහ 2022 වසරේ සිදුකළ මෙහෙවර රැගත් කාර්ය සාධන වාර්තාව මනාව සම්පාදනයට ක්‍රියා කළ සංවර්ධන හා සැලසුම් අංශයේ සහකාර අධ්‍යක්ෂ ඊ.ඒ.පී ප්‍රසාද් චන්දන මහතාට ද 2022 වසරේ අභියෝග ජය ගනිමින් ක්‍රියා කළ මාගේ සහකාර අධ්‍යක්ෂවරුන් වන කසුන් සෙනවිරත්න මහතාට , කියාරා මන්දුලි මහත්මියට ගණකාධිකාරී තුමා සහ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාව ප්‍රකාශ කරමි.

2022 වසර තුළ පැවති දේශීය ආර්ථිකය හා ගෝලීය අර්බුදය තුළ වුව ද අප දෙපාර්තමේන්තුවෙන් කලාව හා කලාකරුවන් උදෙසා කළ හැකි සෑම සහනයක් හා සේවාවක් ලබා දීමට අපට හැකියාව ඇති බව අපගේ කාර්ය සාධනය අනුව ප්‍රත්‍යක්ෂ වනු ඇත. ඉදිරි වසරේ ද මේ තත්ත්වයට නව්‍ය පදනමක් ඇති කරමින් ආදායම් උත්පාදන මාර්ග විවර කර දීමත් කලාව හා සංස්කෘතිය විෂයෙහි රාජ්‍ය ආදායම ශක්තිමත් කිරීමේ ක්‍රියාවලියකට අවතීර්ණවීමත් අප විසින් ආරම්භ කර ඇති අතර ඒ සම්බන්ධයෙන් වූ වැඩසටහන් සමුදායක් සමග 2023 වසර ජයග්‍රහණය කිරීමට හැකිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

**භාග්‍යා සී කටුදෙණිය**
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ (වැ.බ)

**2022 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව**

**පරිච්ඡේදය 01** - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ ආකාරය

1.1 හැඳින්වීම
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු
1.3 ප්‍රධාන කාර්යයන්
1.4 සංවිධාන සටහන
1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ
1.6 දෙපාර්තමේන්තු අරමුදල්
1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති තොරතුරු (තිබේ නම්)
ව්‍යාපෘතිය
දායක නියෝජිතායතනය
ව්‍යාපෘති ඇස්තමේන්තුගත වියදම
ව්‍යාපෘති කාලසීමාව

**පරිච්ඡේදය 02** - ප්‍රගතිය හා ඉදිරි දැක්ම
විශේෂ, ජයග්‍රහන/අභියෝග හා ඉදිරි ඉලක්ක
ආයතන ප්‍රධානියා විසින් අත්සන් කළ යුතුය

**පරිච්ඡේදය 03** - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

**පරිච්ඡේදය 04** - කාර්ය සාධන දර්ශක

**පරිච්ඡේදය 05** - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

**පරිච්ඡේදය 06** - මානව සම්පත් පැතිකඩ

**පරිච්ඡේදය 07** - අනුකූලතා වාර්තාව

1.1 **හැඳින්වීම**

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

1956 වසරේ බලයට පත් වූ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතානන්ගේ ජනතා රජය යටතේ 1956 සැප්තැම්බර් මස 26 දිනැති අංක 10975 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබීය. (ඇමුණුම පිටු අංක 53)

ශ්‍රී ලාංකේය අනන්‍යතාවයෙන් යුත් සාහිත්‍ය කලා හා සංස්කෘතික කටයුතු සංරක්ෂණය, ප්‍රවර්ධනය, සහ ව්‍යාප්තිකරණය සඳහා වැඩසටහන් සම්පාදනය කිරීමෙන් සහ ක්‍රියාත්මක කිරීමෙන් සංස්කෘතික ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා මෙම දෙපාර්තමේන්තුව සුවිශාල මෙහෙවරක් ඉටුකරනු ලබයි.

දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන මහාවංස සම්පාදන කාර්යාලය, සිංහල ශබ්දකෝෂ කාර්යාලය, සිංහල විශ්වකෝෂ කාර්යාලය, ජාතික කලාභවන හා ජෝන් ද සිල්වා සමරු රඟහල, උතුරු දකුණු මිතුරු සෙවණ සංස්කෘතික කේන්ද්‍රය, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය පුහුණු පාසල, වලිසිංහ හරිස්චන්ද්‍ර කෞතුකාගාරය, කුණ්ඩසාලේ ජාතික කලා නිකේතනය ආදිය ද සංස්කෘතික ප්‍රබෝධයක් ඇතිකරලීම සඳහා දෙපාර්තමේන්තු කාර්යයන්ට උර දී ක්‍රියා කරයි.

ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික නර්තන කලාවේ උන්නතියට විසල් මෙහෙවරක යෙදෙන රාජ්‍ය නර්තන කණ්ඩායම සහ රාජ්‍ය සංගීත කණ්ඩායම ද සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යනු ලැබේ.

කලාකරු සබඳතා, සාහිත්‍ය හා ප්‍රකාශන, සංස්කෘතික ප්‍රවර්ධන, සංවර්ධන හා සැලසුම්, පාලන, ගිණුම් සහ ප්‍රසම්පාදන යනුවෙන් අංශ 07ක් යටතේ දෙපාර්තමේන්තු කටයුතු ක්‍රියාත්මක වන අතර සංස්කෘතික ප්‍රවර්ධන අංශය යටතේ උපදේශක මණ්ඩල 09 ක් මඟින් රාජ්‍ය උත්සව හා ජාතික සැමරුම් උළෙල සඳහා සඵලදායී දායකත්වයක් ලබාදේ.

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ඉටුකිරීමට සහ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සඳහා සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක් සඳහා සංස්කෘතික නිලධාරීවරයෙක් හෝ සංස්කෘතික සංවර්ධන සහකාර නිලධාරීවරයෙක් /සංවර්ධන නිලධාරීවරයෙක් බැගින් අනුයුක්ත කොට ඇති අතර එම නිලධාරීන් හරහා දෙපාර්තමේන්තු කාර්යභාර්ය ග්‍රාමීය ජනතාව දක්වා ව්‍යාප්ත කිරීමට පියවර ගෙන ඇත.

වාර්ෂික වැඩ සැලැස්මකට අනුව දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන් මෙහෙයවීම සිදුකෙරෙන අතර දොළොස්මහේ පහන හා සාහිත්‍ය මහෝත්සව මේ අතර ප්‍රධාන තැනක් ගනී. තත් වැඩසටහන්හි ප්‍රගතිය දිස්ත්‍රික් නිලධාරීන් හරහා කාර්තු වශයෙන් සංස්කෘතික දෙපාර්තමේන්තුවට ලබාගැනීම සිදුකෙරෙන අතර සඵලදායී නියාමනයක් හා අධීක්ෂණයක් සඳහා තත් කාර්යයන් සම්බන්ධයෙන් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂවරුන් ක්‍රියා කරයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### 1. 2. 1 දැක්ම

නිවුණු හැදුණු පිරුණු සොඳුරු මිනිසුන් සපිරි පින්බර දේශයක් එක්ව ගොඩනැගීම

### 1.2.2 මෙහෙවර

ශ්‍රී ලාංකීය අනන්‍යතාවයෙන් යුත් අස්පර්ෂීය සංස්කෘතිය සංරක්ෂණය ප්‍රවර්ධනය ව්‍යාප්තිකරණය සඳහා වූ වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම

### 1.2.3 අරමුණු

ශ්‍රී ලාංකේය සංස්කෘතික පුරුෂාර්ථ හා ආචාර ධර්ම අනාගත පරපුරට දායාද කිරීම සඳහා අස්පර්ෂ උරුමයන් සංරක්ෂණය

සාම්ප්‍රදායික සංස්කෘතිකාංග හා අස්පර්ෂ උරුමයන් සංරක්ෂණය කරමින් දේශීය අනන්‍යතාව ප්‍රකටනය කිරීම උදෙසා අස්පර්ෂ උරුමයන් ප්‍රවර්ධනය

සාරධර්ම සම්පන්න සමාජයක් ගොඩනැගීම උදෙසා අස්පර්ෂ උරුමයන් ව්‍යාප්තිකරණය

උසස් රසවින්දනයක් උදෙසා නිර්මාණ ප්‍රමිතිගත කිරීම

කලාකරුවන්ගේ ජීවන මට්ටම උසස් කිරීම

සියලුම කලාංගයන් තුළ තිබෙන ශාස්ත්‍රානුකූල බව සුරැකීම

**1.3 ප්‍රධාන කාර්යයන්**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ප්‍රමුඛතා පරාසයන් Trust Areas 6ක් හඳුනා ගනිමින් ඒ අනුව දියත් කෙරේ. මේ අතර

කලාකරුවන්
කලා නිර්මාණ
කලා ආයතන
කලා සංගම්
නිලධාරීන්
මහජනතාව

යන අංශ විස්තර කළ හැකිය. මේ යටතේ ඉලක්ක ගත කාර්යයන් සාක්ෂාත් කර ගැනීමට කටයුතු කෙරෙන අතර කලාකරුවන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම කලාකරුවන්ට සම අවස්ථා ලබාදීම වෙනුවෙන් උපාය මාර්ග දියත් කෙරෙන අතර කලාකරුවන්ගේ දැනුම කුසලතා ආකල්ප සංවර්ධනය කිරීම හා උසස් ජීවන මට්ටමක් පවත්වාගෙන යාමට පහසුකරණය සඳහා වූ කාර්යයන් දියත් කෙරේ.

කලා නිර්මාණ යටතේ උසස් රසවින්දනයක් ඇතිකිරීම සඳහා කලා නිර්මාණයන්හි ප්‍රමිතිය ඉහළ නැංවීම හා සාම්ප්‍රදායික කලා නිර්මාණ ජනගත කිරීම හා ප්‍රදර්ශන හා සංදර්ශන සඳහා වූ කාර්යයන් දියත් කෙරේ.

කලා ආයතන සම්බන්ධයෙන් ප්‍රශස්ත සේවාවක් හා දීප ව්‍යාප්ත සේවාවක් ඇතිකරනු වස් ප්‍රශස්ත සේවාව, ඇගයීම හා ප්‍රමිතිගත කිරීම, ආදිය උදෙසා යහපාලනය අධීක්ෂණය, ඇගයීම, නියාමනය (තක්සේරු කිරීම) යන කාර්යයන් සාක්ෂාත් කර ගැනීමට කටයුතු කෙරෙන අතර ඒ සඳහා වූ වැඩසටහන් හා ව්‍යාපෘති දියත් කෙරේ.

කලා සංගම් යටතේ ප්‍රශස්ත සේවාවක් හා දීප ව්‍යාප්ත සේවාවක් ඇතිකරනු වස් ප්‍රශස්ත සේවාව, ඇගයීම හා ප්‍රමිතිගත කිරීම, ආදිය උදෙසා යහපාලනය අධීක්ෂණය, ඇගයීම, නියාමනය (තක්සේරු කිරීම) යන කාර්යයන් සාක්ෂාත් කර ගැනීමට කටයුතු කෙරෙන අතර ඒ සඳහා වූ වැඩසටහන් හා ව්‍යාපෘති දියත් කෙරේ.

නිලධාරීන් වෙනුවෙන් සිදුකෙරෙන හා නිලධාරීන් යොදවා සිදුකෙරෙන කාර්යයන් සඳහා වගකීමෙන් හා වගවීමෙන් ඵලදායීව කටයුතු කරන රාජ්‍ය සේවකයෙකු බිහිකිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම සිදුවන අතර දැනුම කුසලතා ආකල්ප වර්ධනය, යහපාලනය සහ අභිප්‍රේරණය යන උපාය මාර්ගයන්ට අදාල කාර්යයන් දියත් කෙරේ.

මහජනතාව උදෙසා දක්වන ආකල්පය හා මෙහෙවර යටතේ ශික්ෂාකාමී ජන සමාජයක් ගොඩනැගීමට අවශ්‍ය පසුබිම සැකසීම සහ රසවින්දනයක් ඇති කිරීමට කටයුතු කිරීම සිදුකෙරෙන අතර මේ සඳහා දැනුම කුසලතා ආකල්ප වර්ධනය, යහපාලනය, නිර්මාණ ප්‍රමිතිගත කිරීම සහ ඇගයීම යන උපාය මාර්ගයන්ට අදාල කාර්යයන් දියත් කෙරේ.

## 1.4 සංවිධාන සටහන



## 1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

### සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන හා ප්‍රධාන අංශ

### 1.5.1 ජාතික කලාභවන හා ජෝන් ද සිල්වා සමරු රඟහල

ජාතික වටිනාකමකින් යුතු ජාතික කලාභවන හා ජෝන් ද සිල්වා රඟහල පරිශ්‍රය කලාකරුවන් සඳහා කදිම තෝතැන්නකි. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ජාතික කලාභවන හා ජෝන් ද සිල්වා සමරු රඟහල රජයේ මෙන් ම වෙනත් බාහිර පාර්ශවයන් විසින් සංවිධානය කරනු ලබන උත්සව, ප්‍රදර්ශන හා විවිධ වැඩසටහන් සඳහා කුලී පදනම මත වෙන් කරවා ගත හැකිය.

දැනටමත් සිදුකරමින් පවතින ඉදිකිරීම් සැලසුම් 90% ක් අනුමත වී ඇති අතර ජෙනරේටර් කාමරයේ ඉදිකිරීම් හා විදුලි සෝපානයේ කාර්යයන් ආරම්භ කර ඇත.

### 1.5.2 මහාවංස සම්පාදන කාර්යාලය

ශ්‍රී ලාංකේය ප්‍රෞඩ ඉතිහාස ග්‍රන්ථය වන මහාවංසය සම්පාදනය කිරීම සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ සිදුවේ. 1935 දක්වා ලියැවී ඇති මහාවංස කාණ්ඩ 03ට අමතරව 1935 සිට 1956 දක්වා රාජ්‍ය පරිපාලන යුගය අළලා මහාවංසයේ සිව් වෙනි කලාපය සකස් කර ඇති අතර, 1956 සිට 1978 දක්වා මහාවංසය ලිවීම 2008 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. එම පරිපාලන යුග අළලා සැකසෙන මහාවංසය සිංහල හා පාලි භාෂාවෙන් සකස් කෙරෙන අතර මහාවංස සම්පාදන කාර්යාලය මඟින් මෙම කාර්යභාරය ඉටු කරයි.

### 1.5.3 සිංහල ශබ්දකෝෂ කාර්යාලය

සිංහල භාෂාව සඳහා අකාරාදි ක්‍රමයේ ශබ්දකෝෂයක් සම්පාදනය කිරීමට පුරෝගාමී උගතුන් සිංහල ඉංග්‍රීසි ශබ්දකෝෂයක අවශ්‍යතාව හඳුනාගෙන 1972 දී රාජ්‍ය අනුග්‍රහය යටතේ සිංහල ශබ්දකෝෂ කාර්යාලය ආරම්භ කරන ලදී. පසු කාලයේ දී වෙනස්වීම්වලට භාජනය වූ ව්‍යවස්ථා වෙනස්කම්, රාජ්‍ය ප්‍රතිපත්ති සහ විධායකය විසින් ගනු ලබන විවිධ තීන්දු තීරණවලට අනුගතව කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි ක්‍රියාත්මක කරමින් වර්තමානය වන විට ශබ්දකෝෂ කාර්යාලයෙන් දියත් කෙරෙන ව්‍යාපෘති සංඛ්‍යාව 07ක් දක්වා වර්ධනය වී ඇත.

### 1.5.4 විශ්වකෝෂ කාර්යාලය

විශ්ව ඥානය සිංහල භාෂාවෙන් සැපයීමේ අවශ්‍යතාව සපුරාලනු වස් විවිධ මාතෘකා යටතේ අකාරාදි පිළිවෙළට ග්‍රන්ථගත කොට කාණ්ඩ මඟින් ප්‍රකාශයට පත් කිරීම මෙමඟින් සිදු කෙරෙයි. මේ වන විට සිංහල විශ්වකෝශයේ කාණ්ඩ 13ක් නිකුත් කර ඇත. මෙහි ඉලක්කගත කාණ්ඩ ප්‍රමාණය 20කි. 1 සිට 12 දක්වා කාණ්ඩ වර්ෂ අනුව 1963, 1965, 1967, 1970, 1974, 1978, 1988, 1991, 1994, 1998, 2001, 2006, 2010, 2014 පරිදි නිකුත් කර ඇත.

### 1.5.5 එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය පුහුණු පාසල

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා නාට්‍ය කලාව වෙනුවන් කළ අනුපමේය සේවය අඟය කිරීම සහ විධිමත් පරිදි නාට්‍ය කලාව අධ්‍යයනය කිරීමේ අඩුව පිරිමසාලීම සඳහා නාට්‍ය පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක කිරීම අරමුණු කර ඇත. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ විෂයපථය අනුව නාට්‍ය නිර්මාණකරණයේ දී, පුහුණුවේදී හා අධ්‍යයනයේ දී වන අවශ්‍යතා සපුරාලීම සඳහා මෙන්ම සිංහල හා දෙමළ ජාතික අන්තර්සහජීවනයේ සංස්කෘතිකමය සබැඳියාව සහ නිර්මාණකරණය වර්ධනය කිරීම තුළින් ජාතික සමගිය ගොඩනැගීම පදනම් කරගනිමින් මෙම ව්‍යාපෘතිය ආරම්භ විය.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොස්වත්තේ පිහිටි පැරණි සිරි සුමේධ පාසල පිහිටි පර්චස් 31.1ක බිම් කොටස සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට පවරාගෙන එහි පැරණි පාසල් ගොඩනැගිල්ල නාට්‍ය පුහුණු මධ්‍යස්ථානයක් ලෙස නවීකරණය කිරීම මෙහිදී සිදු කරනු ලැබීය. පූර්ණ අලුත්වැඩියාවකින් පසු 2015 මාර්තු 11 වන දින උත්සවාකාරයෙන් විවෘත කිරීම සිදු කරන ලදි.

මේ වන විට මෙහි රාජ්‍ය නර්තන සහ සංගීත කණ්ඩායම්වල පුහුණුවීම් කටයුතු සිදු කෙරෙන අතර, මීට අමතරව නාට්‍ය පුහුණුවීම් කටයුතු සඳහා බාහිර පාර්ශ්වයන් වෙත සහන මිලක් මත ලබාදෙනු ලැබේ.

### 1.5.6 වලිසිංහ හරිස්චන්ද්‍ර කෞතුකාගාරය හා සංස්කෘතික කේන්ද්‍රය

ජාතික සටනේ පුරෝගාමියෙකු වූ වලිසිංහ හරිස්චන්ද්‍ර මැතිතුමාගේ මහ හුණුපිටිය, කටාන පිහිටි නිවස හා හෙක්ටෙයාර් 0.2118ක් වූ ඉඩම 2011.06.24 දින සිට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට පවරා දෙන ලදි.

මෙම ස්ථානය සංස්කෘතික මධ්‍යස්ථානයක් වශයෙන් සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනයට යොදවා ගනු ලැබේ. ඒ අනුව ශ්‍රී ලාංකීය සංස්කෘතිකාංග හා වලිසිංහ හරිස්චන්ද්‍රතුමා පරිහරණය කළ නිවාස උපකරණ පිළිබඳ ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් දැනුවත් කිරීමේ අරමුණින් ජාතික හා ජාත්‍යන්තර වැදගත් කෞතුකාගාරයක් බවට පත්කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කොට ඇත.

සැප්තැම්බර් 13 ට යෙදෙන වලිසිංහ හරිස්චන්ද්‍ර ගුණානුස්මරණ උළෙල මූලික කොටගත් වැඩසටහන් මෙහිදී ක්‍රියාත්මක කරනු ලබන අතර දෙනිකව විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති මඟින් ප්‍රදේශයේ සංස්කෘතික හා කලා පුනරුදයට අවශ්‍ය පසුබිම මෙහිදී ගොඩනැගීමට කටයුතු කර ඇත.

### 1.5.7 ජාතික කලා නිකේතනය - මහනුවර කුණ්ඩසාලේ

කලා නිර්මාණකරණය, නව අත්හදාබැලීම් හා පර්යේෂණකරණය, දේශීය හා විදේශීය කලා කෘති පරිශීලනය හා කලාව පිළිබඳ අධ්‍යයනය හා අධ්‍යාපනය ලබාදීම සඳහාත්, ප්‍රාසාංගික හා හස්තමය නව කලාවන් පිළිබඳ අධ්‍යයනය හා අධ්‍යාපනය ලබාදීම සඳහාත්, ප්‍රාසාංගික හා හස්තමය නව නිර්මාණ බිහිකිරීමත් එම කලා කෘති ප්‍රදර්ශනය හා අලෙවිය තුළින් ජාතික හා අන්තර්ජාතික ප්‍රචාරණයක් ලබාගැනීම සඳහාත් අවශ්‍ය භෞතික තාක්ෂණික හා බුද්ධිමය සම්පත්වලින් පරිපූර්ණ වූ සෞන්දර්ය කේන්ද්‍රයක් බිහිකිරීමත් අරමුණු කරගෙන 2008 ජනවාරි මාසයේ කුණ්ඩසාලේ ජාතික කලා නිකේතනයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදි.

මෙහි මුළු ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 465 කි. පළමු අදියර යටතේ එළිමහන් රංග ශාලාව, වැසිකිළි කැසිකිළි පද්ධතිය මාර්ග පිළිසකර කිරීම, රැඳවුම් බැම්ම හා කාණු පද්ධතිය ඉදිකිරීම සිදුකළ අතර දෙවන අදියර යටතේ කලා ශිල්පී නිවාඩු නිකේතනය, ප්‍රභූ නිවාඩුනිකේතය, ජල ටැංකිය සහ කුළුණ, එළිමහන් රඟහල සහ නේපත්‍යාගාරය ඉදිකිරීම, පිරිමි සහ කාන්තා නේවාසිකාගාර, පුහුණු ශාලා අංක 1 සහ 2 ඉදිකිරීම සහ භූමි සැලසුම සැකසීම සිදුවිය

මෙය 2018 වසරේ උත්කර්ෂවත් අයුරින් විවෘත කිරීමට කටයුතු කෙරිණි.

### 1.5.8 උතුරු දකුණු මිතුරු සෙවණ

උතුරේ සහ දකුණේ ජීවත් වන සිංහල, දෙමළ කලාකරුවන් ඒකරාශී කරමින් නිර්මාණ බිහිකිරීමේ අවස්ථාවක් ලබාදීම සහ ජාතික සමගිය කලාකරුවන් හරහා ගොඩනැංවීම අරමුණු කරගනිමින් උතුරු දකුණු මිතුරු සෙවණ ස්ථාපනය කරන ලදි.

2012 දැයට කිරුළ වෙනුවෙන් වෙන් වූ මුදල භාවිතා කරමින් අනුරාධපුර මිහින්තලේ නගරයේ මෙම කලා නිර්මාණ අසපුව ඉදිකරනු ලැබිය. මෙහි ප්‍රධාන ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තුගත මුදල රු.මි.10කි. මේ ව්‍යාපෘතියේ එළිමහන් රංග ශාලාව, ප්‍රධාන ශාලාව සහ නේවාසිකාගාරය ඇතුළත් ය.

### 1.5.9 පොත් ගබඩාව සහ පොත් අලෙවිසැල

දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කරනු ලබන සියලුම පොත් බෙදා හැරීම සිදු කරන තෙක් කටුවාවල පිහිටා ඇති දෙපාර්තමේන්තු ගබඩාවේ ගබඩා කර තබනු ලැබේ. පොත් අලෙවිසැල ක්‍රියාත්මක වන්නේ සිංහල ශබ්දකෝෂ කාර්යාල පරිශ්‍රයේ ය.

මෙහිදී සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් අලෙවි කරනු ලබන සියලුම වර්ගවල පොත් ඉතා සහන මිල ගණන් යටතේ මිල දී ගැනීමට හැකියාව ඇත.

### 1.5.12 රාජ්‍ය නර්තන කණ්ඩායම

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පවතින රාජ්‍ය නර්තන කණ්ඩායම දිවයිනේ දක්ෂ ශිල්පීන් ශිල්පිනියන් සංචිතයකින් සැදුම් ලැබ ඇත. දෙස් විදෙස් ප්‍රසංග අවස්ථා ආවරණය කරමින් රාජ්‍ය අංශයේ කාර්යයන් සඳහා සිය ප්‍රසංග දායකත්වය ලබාදෙන රාජ්‍ය නර්තන කණ්ඩායම ශිල්පීන් හා ශිල්පිනියන් 29 දෙනෙකුගෙන් සමන්විත වේ.

### 1.5.13 රාජ්‍ය සංගීත කණ්ඩායම

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පවතින රාජ්‍ය සංගීත කණ්ඩායම ගායන හා වාදන ශිල්පීන් සහ ශිල්පිනියන් 42 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමකි. දෙස් විදෙස් ප්‍රසංග අවස්ථා ආවරණය කරමින් රාජ්‍ය අංශයේ කාර්යයන් සඳහා සිය ප්‍රසංග දායකත්වය ලබාදෙන රාජ්‍ය සංගීත කණ්ඩායම දිවයිනේ ප්‍රකට වාද්‍ය වෘන්දයකි.

### 1.5.14 දෙපාර්තමේන්තුවේ අංශ

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව අංශ 07 ක් ක්‍රියාත්මක කරමින් කළමනාකරණය දියත් කෙරේ මේ අතර පාලන අංශය, කලාකරු සබඳතා අංශය, කලා ප්‍රවර්ධන අංශය, සාහිත්‍ය හා ප්‍රකාශන අංශය, ගිණුම් අංශය, සැලසුම් හා සංවර්ධන අංශය සහ ප්‍රසම්පාදන අංශය වේ. සහකාර අධ්‍යක්ෂවරුන් 04 දෙනෙකු හා අංශ ප්‍රධානීන් 07 දෙනෙකුගෙන් අධීක්ෂණය මෙහෙයවීම් සිදුකෙරෙන මෙම අංශයන් මගින් දෙපාර්තමේන්තු කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාවට නැංවේ.

### 1.6 දෙපාර්තමේන්තු අරමුදල්

### 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති තොරතුරු (තිබේ නම්) නැත

## 2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ, ජයග්‍රහණ/අභියෝග හා ඉදිරි ඉලක්ක

### 2.1 ප්‍රගතිය

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් කරන ලද කලාකරු සුබසාධන කාර්යයන්හි ප්‍රගතිය

2.1.1 - ජාතික කලාකරු හැඳුනුම්පත් නිකුත් කිරීම

| නිකුත්කළ හැඳුණුම්පත් සංඛ්‍යාව | වියදම රුපියල් |
|---|---|
| 297 | 21,384.00 |

2.1.2 - වෛද්‍යාධාර ලබාදීම

| වෛද්‍යාධාර සංඛ්‍යාව | වියදම රුපියල් |
|---|---|
| 158 | 2,255,000.00 |

2.1.3 - අගහිඟ කලාකරු ආධාර

| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම රුපියල් |
|---|---|---|
| සිංහල මාධ්‍ය | 2766 | 27,660,000.00 |
| දමිළ මාධ්‍ය | 355 | 3,550,000.00 |
| එකතුව | 3121 | 31,210,000.00 |

2.1.4 - කලායතන ආධාර ලබාදීම

සිංහල මාධ්‍ය කලායතන

| ශ්‍රේණිය | කලායතන සංඛ්‍යාව | එක් කලායතනයක පිරිවැය | සමස්ත පිරිවැය |
|---|---|---|---|
| අධිශ්‍රේණියේ කලායතන | 88 | 10,000/- | 880,000/- |
| විශිෂ්ට ශ්‍රේණියේ කලායතන | 341 | 6000/- | 2,046,000/- |
| සාමාන්‍ය කලායතන | 787 | 4500/- | 3,541,500/- |
| එකතුව | 1216 | | 6,467,500/- |

දමිළ මාධ්‍ය කලායතන

| ශ්‍රේණිය | කලායතන සංඛ්‍යාව | එක් කලායතනයක පිරිවැය | සමස්ත පිරිවැය |
|---|---|---|---|
| අධිශ්‍රේණියේ කලායතන | 08 | 10,000/- | 80,000/- |
| විශිෂ්ට ශ්‍රේණියේ කලායතන | 32 | 6000/- | 192,000/- |
| සාමාන්‍ය කලායතන | 32 | 4500/- | 144,000/- |
| එකතුව | 72 | | 416,000/- |

2.1.5 - පෙරහැර ආධාර ලබාදීම

| පෙරහැර ආධාර සංඛ්‍යාව | වියදම රුපියල් |
|---|---|
| 4 | 203,000.00 |

2.1.6 - අවමංගල්‍යාධාර ලබාදීම

| සංඛ්‍යාව | වියදම රුපියල් |
|---|---|
| 90 | 1,730,160.00 |

2.1.7 - විවිධ උත්සව ආධාර ලබාදීම

| සංඛ්‍යාව | වියදම රුපියල් |
|---|---|
| 12 | 451,000.00 |

2.1.8 - ලියාපදිංචි වූ සංස්කෘතික සංගම් හා කලායතන සංඛ්‍යාව

| | සංස්කෘතික සංගම් | කලායතන |
|---|---|---|
| සිංහල මාධ්‍ය | 12 | 2069 |
| දමිළ මාධ්‍ය | - | 192 |
| එකතුව | 12 | 2261 |

2.1.9 - කලාකරු සුවදම් වැඩසටහන (ජාතික මිටටම)

| සංඛ්‍යාව | වියදම රුපියල් |
|---|---|
| 01 | 10,000.00 |

2.1.10 - කලාකරු සුවදම් වැඩසටහන (ප්‍රාදේශීය මිටටම)

| සංඛ්‍යාව | වියදම රුපියල් |
|---|---|
| 335 | 5,435,375.00 |

2.1.11 - රාජ්‍ය සංගීත කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද උත්සව/ප්‍රසංග

| දේශීය | විදේශීය |
|---|---|
| 20 | නැත |

2.1.12 - රාජ්‍ය නර්තන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද උත්සව/ප්‍රසංග

| දේශීය | විදේශීය |
|---|---|
| 51 | නැත |

2.1.13 - ලේඛකාධාර ව්‍යාපෘතිය සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍ය

| මාධ්‍ය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මිලදී ගත් පොත් සංඛ්‍යාව | මුලු පිරිවැය (රු.මි) |
|---|---|---|---|
| සිංහල | 118 | 7,619 | 4.3 |
| දෙමළ | 43 | 2,318 | |
| ඉංග්‍රීසි | 07 | 376 | |

මීට අමතරව සමීක්ෂණ මණ්ඩල දීමනා ගෙවීම හා පුවත්පත් දැන්වීම් සඳහා වූ මුදල් ඒකතුව රුපියල් 639,305.60 ක මුදලක් ලේඛකාධාර ව්‍යාපෘතිය යටතේ වියදම් කර ඇති අතර ලේඛකයින් සහ බාහිර සංස්කාරකවරුන්ට පහසුකම් සැපයීම සඳහා වන වැයවිෂය 206-2-2-5-1409 යටතේ සිදුකර ඇත.

2.1.14 - ජාතික සාහිත්‍ය උත්සවය

| අංකය | ජයග්‍රහන ප්‍රමාණය | වියදම (රු) | වෙනත් කරුණු |
|---|---|---|---|
| | ප්‍රථම ස්ථාන 76<br>දෙවන ස්ථාන 76<br>තෙවන ස්ථාන 77 | 5,785,487.82 | ජාතික සාහිත්‍ය උත්සවය 2022 වර්ෂයේ නොවැම්බර් මස 17 වන දින කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී සිදුකෙරිණ. |

2.1.15 - සදෙස ත්‍රෛමාසික සඟරාව නිකුත් කිරීම

| කාර්තුව | කලාපය | පිටපත් සංඛ්‍යාව | වියදම (රු) |
|---|---|---|---|
| මුද්‍රණය කිරීම සඳහා ප්‍රතිපාදන නොමැති බැවින් අන්තර්ජාල කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී | | | නැත |

2.1.16 - ජාතික අත්පිටපත් තරඟය

ජාතික අත්පිටපත් තරඟයේ භාෂා ත්‍රිත්වයෙන්ම පුවත්පත් දැන්වීම පලකරන ලදුව ඒ සඳහා රුපියල් 321,105.60 ක් ද සිංහල මාධ්‍ය සමීක්ෂණ කාර්යයන් සඳහා රුපියල් 116,400.00 ක මුදලක් ගෙවීම් වශයෙන් සිදුකරන ලදී.

2.1.17 - පොත් අළෙවිසැලෙන් ලද අදායම

2022 ජනවාරි මස 01 දින සිට 2022 දෙසැම්බර් මස 31 වන දින දක්වා රුපියල් දහසය ලක්ෂ නමදහස් තුන්සිය හැට හයක (රු 1,609,366/-) ක ආදායමක් ලබා ගන්නා ලදී

2.1.18 - 60 - 70 දශකයේ කලාකරු සුබසාධනය

| ප්‍රසංගය පැවැත්වූ දිනය | ස්ථානය | අනුග්‍රාහක ආයතනය |
|---|---|---|
| 2022.10.08 | බටුවත්ත ශාලාව | තුසිත ජයරත්න පදනම |
| 2022.11.08 | කෑගල්ල නගර ශාලාව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කෑගල්ල |
| 2022.12.17 | වයඹ පළාත් ශ්‍රවනාගාරය | වයඹ වෙළඳ සංගමය |

මෙම ප්‍රසංග සඳහා අනුග්‍රාහකත්වය අදාළ අනුග්‍රාහක ආයතනය මගින් ලබාදෙන ලදී. ඒ අනුව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් අදාල සම්බන්ධීකරණය සිදුකරමින් රාජ්‍ය සංගීත කණ්ඩායම හා 60-70 දශකයේ ගායක ගායිකා සංචිතය භාවිත කරමින් එම ප්‍රසංග සංවිධානයට දායකත්වය දක්වන ලදී

**2.2 ඉදිරි දැක්ම**

- රජයට ඇති වැයබර අවම කෙරෙන පරිදි සියලුම උත්සව, ආධාර ලබාදීම ආදී කාර්යයන් සංවිධානය කිරීම හා පවත්වාගෙන යාම
- රාජ්‍ය ආදායමට දායකත්වය ලබා දිය හැකි කාර්යයන් සංවිධානය කිරීම සහ පවත්වාගෙන යාම
- යාවත්කාලීන තොරතුරු එක්රැස් කිරීම
- සමස්ත දිවයිනම ආවරණය වන පරිදි අස්පර්ශනීය උරුම ලැයිස්තුව සම්පාදනය කිරීම
- රාජ්‍ය නර්තන හා සංගීත කණ්ඩායම් ඔස්සේ ද ස්වර අඹර වැඩසටහන ඔස්සේ ද රාජ්‍ය ආදායමට නව අරමුදල් සම්පාදන මාර්ග විවර කර දීම
- දොළොස්මහේ පහන වැඩසටහන නව්‍ය මුහුණුවරකින් ඉදිරිපත් කොට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාල නිලධාරීන්ගේ සේවා ශක්‍යතාව සහ වපසරිය බලගැන්වීම
- දෙපාර්තමේන්තු අනුබද්ධ ආයතන සහ පොත් අළෙවිසල උපයෝගී කර ගනිමින් ආදායම් උත්පාදන මාර්ග වර්ධනය කිරීම හා ආදායම් උත්පාදන කාර්යයන්ට ප්‍රමුඛස්ථානය ලබා දීම
- අනුග්‍රාහක දායකත්වය මත වැඩසටහන් සංවිධානය කිරීම හා ඒකාබද්ධ ප්‍රවේශය කෙරෙහි අවධානය යොමු කිරීම
- බැහැර ආයතනයන්හි දායකත්වය මගින් සිදුකළ හැකි නිර්මාණ ජනගත කිරීමේ කාර්යයන් දියත් කිරීම
- සංස්කෘතික ප්‍රවර්ධන කාර්යයන් පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසහන් ඇසුරෙන් දියත් කිරීම හා දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ නිර්මාණශීලී හැකියාවන් යොදවා ගැනීම
- සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා ලබාදිය හැකි දායකත්වය ලබාදීම
- සංස්කෘතික මිනිසෙකු ගොඩනැගීමේ අමාත්‍යාංශ ව්‍යාපෘතියට අදාළව දේශජ පුරුෂාර්ථ ධර්මයන්ගෙන් අනූන සහ යැපුම් මානසිකත්වයෙන් මිදුණූ ස්වකීය ශක්තිය යොදවා නව නිෂ්පාදන කෙරෙහි නැඹුරු වූ පුද්ගලයෙකු ගොඩනැගීම ඉලක්ක කොට ගනිමින් 2023 වසරේ ක්‍රියාත්මක කිරීමට සහ සැලසුම් කිරීමට නියමිත සියලු ව්‍යාපෘති හා වැඩසටහන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම

## 2.3 විශේෂ ජයග්‍රහණ

2022 වසරේ පැවති තත්ත්වය යටතේ අත්‍යාවශ්‍යයෙන් සිදුකළ යුතු කාර්යයන් දියත් කරන ලදී. මේ සඳහා අවම පිරිවැය තත්ත්වය යටතේ ක්‍රියා කිරීම සිදු වූ අතර 2023 වසර මුලික කොට ගනිමින් අදාළ කාර්යයන් දියත් කිරීමේ ක්‍රමවේද සංවිධානය කරන ලදී.

මේ හැරුණුවිට සංස්කෘතික කටයුතු ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා සහ සංස්කෘතික කටයුතු ක්ෂේත්‍රයේ ක්‍රියාකරන ආයතන හා පුද්ගලයන්ගේ ජීවන මට්ටම උසස් කිරීමට සහ සුභාවිත හා ශාස්ත්‍රානුකූල නිර්මාණ ජනගත කිරීම උදෙසා පියවර ගන්නා ලදී. ඒ සඳහා නව්‍ය කාර්යයන් 2022 වසර මුලික කොට ගනිමින් ක්‍රියාත්මක කෙරිණ.

### 2.3.1 සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ඍජුවම ඉටුකළ කාර්යයන්

2.3.1. 1 **රාජ්‍ය නාට්‍ය උළෙල**

2022 මාර්තු මස 27 වන දින කොළඹ නෙළුම්පොකුණ මහින්ද රාජපක්ෂ රංග ශාලාවේදී සිදුකරන්නට යෙදුණු රාජ්‍ය නාට්‍ය උලෙළ සඳහා නාට්‍ය පිටපත් 150 ක් ද දෙමළ මාධ්‍ය පිටපත් 32 ක් ද වන පරිදි අයදුම්පත් 182ක් ලැබුණි. නාට්‍ය උලෙළේ ජයග්‍රහණ ප්‍රමාණය 83ක් වූ අතර සිංහල මාධ්‍යයෙන් 46 දෙනෙකු සහ දමිළ මාධ්‍යයෙන් 37 දෙනෙකු ඇගයීමට බදුන් විය.

ජීවිතයේ එක් වතාවක් ලැබෙන ජාවපීව සම්මානය වන නාට්‍ය කීර්ති සම්මාන 03ක් 2022 වසරේ ප්‍රදානය කරන්නට යෙදුණී සමස්ත උලෙළ සඳහා රුපියල් එකසිය හතලිස් හතර ලක්ෂ දහනම දහසක (රුපියල් 14,419,000.00) මුදලක් වැය වූ අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් රාජ්‍ය නාට්‍ය උලෙළ සිදුවිය






රාජ්‍ය නාට්‍ය උළෙල සංවිධානයේ ලා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ රාජ්‍ය නාට්‍ය උපදේශක සභාව කටයුතු කරන ලදී. විනිශ්චය මණ්ඩල තෝරා ගැනීම, විනිශ්චය කිරීම් සහ උත්සව සංවිධානයට අවශ්‍ය මගපෙනවීම රාජ්‍ය නාට්‍ය උපදේශක සභාව විසින් ලබාදෙන ලදී.

### 2.3.1. 2 **ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උළෙල**








2022 මාර්තු මස 21 වන දින කොළඹ විල්පින්ස්ටන් රංග ශාලාවේදී පවත්වන ලද ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උළෙල සඳහා සිංහල අයදුම්පත් 586 ක් ද දමිල අයදුම්පත් 459 ක් හා ඉංග්‍රීසි අයදුම්පත් 60 ක් ලැබී තිබිණ. මේ අතරින් ජයග්‍රාහකයන් 48 දෙනෙකු විවිධ තරග අංශ යටතේ තෝරාගන්නා ලද අතර යාවජීව සම්මාන වශයෙන් ප්‍රතිභා ප්‍රණාම සම්මාන 04 ක් සහ කුසුම් පීරිස් අනුස්මරණ සම්මාන 01 ක් වශයෙන් සම්මාන 05ක් ලබාදෙන ලදී සමස්ත උළෙල සංවිධානය සඳහා රුපියල් 4,997.591.50 ක මුදලක් වැය විය.

2.3.1. 3 **රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙළ**







2022 වසරේ ඔක්තෝබර් මස 28 වන දින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සිදු කළ රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙළ සිදුකළ අතර ඉදිරිපත් වූ කෘති සංඛ්‍යාව 1198කි මේ සඳහා නිර්මාණකරුවන් 103 දෙනෙකු ඇගයීමට බදුන් විය. 2022 වර්ෂයන් වෙනුවෙන් යාවජීව සම්මාන වන සාහිත්‍ය රත්න සම්මානයෙන් ජ්‍යේෂ්ඨ ලේඛකයන් 3 දෙනෙක් ඇගයුම් ලැබූ අතර සමස්ත උළෙළ සඳහා රුපියල් 7,330,967.77ක මුදලක් වැය විය.

2.3.1. 4 **රාජ්‍ය ළමා චිත්‍ර උළෙල**

2022 වසරේ රාජ්‍ය ළමා චිත්‍ර උළෙළ සඳහා ළමා චිත්‍ර 100,000කට අධික සංඛ්‍යාවක් ලැබුණු අතර එම වසරේ ම චිත්‍ර වර්ගීකරණය සිදු කර ඇති අතර 2023 වසරේ එම චිත්‍ර විනිශ්චය සඳහා යෝජිතව ඇත.

2.3.1. 05 **අස්පර්ශනීය උරුම රාජ්‍ය සම්මාන උලෙළ**




දිවයිනේ අස්පර්ශනීය උරුම ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීන් ඇගයෙන රාජ්‍ය අස්පර්ශනීය උරුම සම්මාන ප්‍රදානෝත්සවය 2022 මාර්තු මස 29 දින කොළඹ චිල්පින්ස්ටන් රංග ශාලාවේදී සිදුකෙරින දිවයිනේ ප්‍රකට කලාකරුවන් විද්වතුන් සහභාගි වූ මෙම උලෙළ ජාතික උරුම ප්‍රසංග කලා සහ ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන ගරු අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකළ අතර අස්පර්ශනිය උරුම ක්ෂේත්‍රයේ විශේෂඥයන් 10 දෙනෙකු ඇගයීමට බඳුන් විය.

රාජ්‍ය අස්පර්ශනීය උරුම සම්මාන ප්‍රදානෝත්සවය සඳහා සමස්ත වියදම රුපියල් ලක්ෂ 22 ක් විය සම්මානයට පාත්‍ර වූ අස්පර්ශනීය උරුම ක්ෂේත්‍රයේ විශේෂඥයන් සඳහා සම්මානයක් මුදල් ත්‍යාගයක් පරිනමීම සිදුකරන ලද අතර මෙය අස්පර්ශනීය උරුමය විෂයෙහි ශ්‍රී ලංකා රජය විසින් කළ යුතු මැදිහත්වීමක් වශයෙන් සැලකිය හැකිය.

2.3.1. 6 **රාජ්‍ය කෙටි චිත්‍රපට සම්මාන උලෙළ**



2022 වසරේ රාජ්‍ය කෙටි චිත්‍රපට රාජ්‍ය සම්මාන උලෙළ මාර්තු මස 23 වන දින සිදුකෙරින දිවයිනේ ප්‍රථම රාජ්‍ය කෙටි චිත්‍රපට උලෙළ ලෙස සිනමා ක්ෂේත්‍රයේ උන්නතියට සිදුකළ මෙම සම්මානෝත්සවය සඳහා නිර්මාණ 164ක් ලැබුණු අතර සම්මාන 09ක් ලබා දෙමින් නිර්මාණකරුවන් ඇගයීමට බඳුන් කෙරිණ. ජාතික චිත්‍රපට සංස්ථාවේ තරංගනී මැදිරියේදී සිදුකළ මෙම උලෙළේ ප්‍රධාන ආරාධිතයා වශයෙන් සහභාගි වූ අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරින




රාජ්‍ය කෙටි චිත්‍රපට සම්මාන උලෙළ සඳහා ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ රාජ්‍ය සිනමා උපදේශක සභාවේ උපදේශකත්වය ලැබුණු අතර සම්මාන උත්සවය සඳහා රුපියල් 2,672,301.00 ක මුදලක් වැය කෙරින.

2.3.1. 7 **ජාතික සාහිත්‍ය සම්මාන ප්‍රදානෝත්සවය**








ජාතික සාහිත්‍ය තරගයේ ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් ඇගයීම සඳහා වන ජාතික සාහිත්‍ය සම්මාන ප්‍රදානෝත්සවය 2022 නොවැම්බර් මස 17 දින කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී සිදුකෙරින. ජාතික තරගාවලියේ ජයග්‍රහණය ලබාගත් පාසල් සිසු සිසුවියන් 229ක සංඛ්‍යාවක් සම්මානයට පාත්‍ර වූ අතර ප්‍රථම ස්ථාන 76ක් ද දෙවන ස්ථාන 76ක් ද තෙවන ස්ථාන 77 ක් වශයෙන් ඇගයීමට බදුන් විය. සම්මාන ප්‍රදානෝත්සවය සඳහා රුපියල් 5,785,487.82 ක මුදලක් වැය විය

2.3.1. 8 **හුස්මක් ප්‍රසංගය**










සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නර්තන කණ්ඩායම සහ සංගීත කණ්ඩායම සඳහා නවක ශිල්පීන් බඳවා ගැනීමෙන් අනතුරුව ඔවුන්ගේ නිර්මාණ ශක්‍යතා එලිදැක්වීමත් ලාංකේය සංස්කෘතිය හා කලාව පිළිබඳ ජාත්‍යන්තරය දැනුවත් කිරීමත් යන අරමුණු පෙරදැරිව හුස්මක් ප්‍රසංගය සංවිධානය විය

විදේශ තානාපතිවරුන් රැසක් මෙහි ආරාධිත අමුත්තන් ලෙස සහභාගි වූ අතර සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම උදෙසා ශ්‍රී ලාංකේය පාරම්පරික හා නූතන සෞන්දර්ය කලාව මගින් ලබා දිය හැකි දායකත්වය පිළිබඳ නිශ්චිත සංකල්පයක් මෙම ප්‍රසංගය මගින් සමාජගත කරන ලදී

2022 දෙසැම්බර් මස 21 වන දින කොළඹ නෙළුම්පොකුණ මහින්ද රාජපක්ෂ රංග ශාලාවේදී පවත්වන ලද හුස්මක් ප්‍රසංගය සඳහා 1400කට අධික පිරිසක් සහභාගි වූ අතර තවත් 500කට අධික පිරිසකට ආසන ලබාදීමට නොහැකි බැවින් නෙළුම්පොකුණ රංග ශාලාවට ඇතුළුවීමේ අවසරය නොමැතිවිය.

හුස්මක් ප්‍රසංගය සඳහා රුපියල් විසිඅටලක්ෂ විසිපන්දහස් හයසිය හතලිස් දෙකක (රු 2,825,642.00) මුදලක් වැය වූ අතර මෙම ප්‍රසංගයේදී රාජ්‍ය නර්තන කණ්ඩායමේ සහ රාජ්‍ය සංගීත කණ්ඩායමේ ප්‍රවීණ ශිල්පීන් වශයෙන් හා ආරම්භක සාමාජිකයන් වශයෙන් සලකන හා දැනට වීම කණ්ඩායම්වලින් විශ්‍රාම ලබා ඇති 34ක පමණ පිරිසක් සඳහා උපහාර සන්නස් ප්‍රදානය කරමින් ඔවුන් ඇගයීමට බදුන් කරන ලදී.

2.3.1. 9 **කලාභූෂණ රාජ්‍ය සම්මාන උලෙළ**

කලාභූෂණ රාජ්‍ය සම්මාන උලෙළ 2022 මාර්තු මස 31 වන දින කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී සිදුකෙරින. වයස අවුරුදු 60 වැඩි දිවයිනේ ප්‍රවීණ කලාකරුවන් කලාභූෂණ රාජ්‍ය සම්මානයෙන් ඇගයුම් ලබන අතර සෑම දිස්ත්‍රික්කයක් නියෝජනය වන පරිදි එම කලාකරුවන් තෝරා ගැනීම සිදුවේ. 2022 වසරේ පැවති සම්මාන උලේළේදී කලාකරුවන් 200 දෙනෙකු සම්මානයට පාත්‍ර වූ අතර ඒ සඳහා රුපියල් 8,483,717/- ක මුදලක් වැය කෙරිණ.

2.3.1.10 **සූසැට කලා මංගල්‍යය**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව කොළඹ පොත් සංගමය විසින් සංවිධානය කරන කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේදී 10වන වතාවට විශාල මහජන ප්‍රතිචාර රැසක් මධ්‍යයේ ශ්‍රී ලාංකේය අස්පර්ශනීය සංස්කෘතික උරුමයට අදාළ කලාංග ප්‍රකටනය කරමින් සූසැට කලා මංගල්‍යය සිදුකරන ලදී



මෙහිදී 50 - 60 - 70 දශකයේ ශ්‍රී ලංකාවේ සංගීත ක්ෂේත්‍රයේ ජනාදරයට පත් කලාකරුවන් ගීත ගායනයෙන් දායකත්වය සැපයූ අතර දින 08 ක් පුරා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

කොවිඩ් වසංගතයෙන් අනතුරුව සිදුකළ කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේ විශේෂ අංගයක් වූ සූසැට කලා මංගල්‍යය සඳහා රුපියල් ලක්ෂ 6ක පිරිවැයක් දැරීමට සිදුවූ අතර වැඩිමනක් නිර්මාණ දායකත්වය රාජ්‍ය නර්තන කණ්ඩායම හා සංගීත කණ්ඩායම මගින් ලබා ගැනීමට හැකිවිය. එම

කණ්ඩායම්වලට නවක ශිල්පීන් බඳවා ගැනීම හේතුවෙන් එම ශක්‍යතාව නිර්මාණය වූ අතර පෙර වසරවලට වඩා අවම පිරිවැයකින් මෙම ප්‍රසංග මාලාව සිදුකිරීමට හැකියාව ලැබිණ

සෑම දිනකම ප්‍රසංග දෙකක් (පස්වරු 2.00 සිට 5.00 දක්වා සහ සවස 6.00 සිට රාත්‍රී 8.00 දක්වා) සිදුකරන්නට යෙදුණු අතර අතිවිශාල ප්‍රේක්ෂක ජනතාවකගේ ඇගයීමට බදුන් විය. සෑම ප්‍රසංගයක්ම අවසානයේ සුභාවිත ගී වියමන රාජ්‍ය නර්තන හා සංගීත ප්‍රසංග ඉල්ලුම් කළ ප්‍රේක්ෂකයන් රැසක් හමුවීම මෙහි සාර්ථකත්වය නිර්ණය කිරීමට හේතුපාදක විය.

2.3.1.11 **පොසොන් හේවිසි පූජාව**



සෑම වසරකම පොසොන් පොහොය මුලික කරගනිමින් අනුරාධපුර රුවන්වැලි මහ සෑ රදුන් අභිමුව සිදුකරන රාජ්‍ය පොසොන් හේවිසි පූජාව 36වන වරටත් 2022 ජූනි මස 14 දින සිදුකෙරින. රැය පහන්වන තුරු පැවති මෙම හේවිසි පූජාව සඳහා බැතිමතුන් විශාල පිරිසක් නරඹන්නන් ලෙස සහභාගිවිය. සමස්ත වැඩසටහන සඳහා රුපියල් ලක්ෂ 206,672.00 ක මුදලක් වැය විය. රාජ්‍ය පොසොන් හේවිසි පූජාව වාර්ෂිකව නැරඹීමට ඇලුම් කරන පිරිසක් ද මේ වන විට ගොඩනැගි තිබීමද සතුටට කරුණක් විය.

2.3.1, 12 **රූපවාහිනී රාජ්‍ය සම්මාන උළෙල**

2022 වසරේ රූපවාහිනී රාජ්‍ය සම්මාන උත්සවය පැවැත්වීමට අවශ්‍ය ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් ද උත්සව පැවැත්වීම කෙරෙහි පනවා තිබූ සීමා හේතුවෙන් ද තත් සම්මාන උත්සවය සිදු නොකළ අතර නිර්මාණ භාර ගැනීම පිළිබඳ කාර්යය සහ තරග අංශ කිහිපයක විනිශ්චය කාර්යයන් දියත් කරන ලදී. අදාළ විනිශ්චය කාර්යයන් හා සම්මාන ප්‍රදානය සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා 2022 වසර මූලික කර ගනිමින් රුපියල් පන්ලක්ෂ අසූ හත්දහස් දෙසිය හතලිස් නමයයි සත හැටනමයක (රුපියල් 587,249.69 ක) මුදලක් වැය කර ඇත.

2.3.1, 13 **ජාතික අත්පිටපත් තරගාවලිය**

2022 ජාතික අත්පිටපත් තරගාවලිය පැවැත්වූ අතර සඳහා තරගකරුවන් 111 විසින් අත්පිටපත් 111ක් ලබාදීම සිදුවිය. එම අත්පිටපත් විනිෂ්චය සඳහා යොමු කළ අතර විනිෂ්චය මණ්ඩලයේ නිර්දේශය මත උසස් තත්ත්වයේ අත්පිටපත් 07ක ප්‍රමාණයක් තෝරා ගන්නා ලදී. ඒ සඳහා රුපියල් 116,900/- ක මුදලක් වැයකළ අතර එම අත්පිටපත් ප්‍රතිපාදන ලැබීම මත මුද්‍රණය කිරීමට කටයුතු කෙරේ.

2.3.1, 14 **දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සාහිත්‍ය උත්සව**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 335ක සාහිත්‍ය උත්සව පවත්වන ලද අතර ඒ සඳහා රුපියල් 13,400,000/ ප්‍රතිපාදනයක් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් ලබාදෙන ලදී. එමෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25ක සාහිත්‍ය උත්සව සඳහා රුපියල් 1500,000/- මුදලක් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් ලබාදුන් අතර  එම මුදල් ප්‍රමාණවත් නොවන බැවින් එම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන් විසින් තම ආයතන ප්‍රධානියාගේ සහයෝගය ඇතිව එම ප්‍රදේශවලින් අනුග්‍රාහක භවතුන් සම්බන්ධකර ගැනීමට කටයුතු කරන ලදී.

සාහිත්‍ය උත්සව වර්ණවත් කිරීම සඳහා විවිධ වැඩසටහන් එක් එක් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් සිදුකළ අතර ගීත රසවින්දන, සාහිත්‍ය දේශන, නාට්‍ය රසවින්දන, නර්තන හා ශාන්තිකර්ම කලාව, රූකඩ නාට්‍ය කලාව, ආදිය මේ අතර විය. සෑම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සාහිත්‍ය උත්සවයක් සඳහාම එම කොට්ඨාසයට අයත් කලායතන උපයෝගි කරගනිමින් ප්‍රාසංගික අංග ඉදිරිපත් කළ අතර ඔවුන් සඳහාද සහභාගිත්ව සහතිකයක් හෝ ත්‍යාගයක් ලබාදීමට කටයුතු කර ඇත. මෙහිදී සාහිත්‍ය තරග ජයග්‍රාහකයන්ට ත්‍යාග හා සහතිකපත් ලබාදීම සිදුවූ අතර සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ලද පොත් කට්ටලවලට අමතරව එම ප්‍රදේශවල නිලධාරීන් විසින් තම ශක්‍යතාව මත සපයා ගන්නා ත්‍යාග එම සිසුන්ට ලබාදීමට කටයුතු කර තිබුණි

සෑම උත්සවයක්ම ඉතා වර්ණවත් අයුරින් ද එම ප්‍රදේශයේ හෝ කාර්යාලයේ සම්පත් හා ශක්‍යතාව උපරිම අයුරින් භාවිත කරමින් උත්සව සංවිධානය වූ අතර පාසල් සිසුන් කලායතන සිසුන් මෙන්ම සංස්කෘතික බලමණ්ඩල සාමාජික සාමාජිකාවන් ද ප්‍රදේශයේ කලාකරුවන් ද මේ සඳහා සහභාගි වී ඇති බව සඳහන් ය. මේ අතර බොහෝ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දිවයිනේ ප්‍රමුඛ පෙලේ විද්වතෙකු සාහිත්‍යධරයෙකු හෝ කලාකරුවෙකු මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ආරාධනා කර සම්බන්ධ කර ගෙන ඇත.

සෑම දිස්ත්‍රික්කයකම සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම සිදුකෙරෙන ප්‍රධානම උත්සවය වන සාහිත්‍ය මහෝත්සවය සෑම දිසාපතිවරයෙක්ම සහ ප්‍රාදේශීය ලේකම්වරයෙක්ම ඉතා උත්කර්ෂවත් අයුරින් සිදුකිරීමට කටයුතු කරයි. එබැවින් සාපේක්ෂ වශයෙන් එම උත්සව ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් වශයෙන් උසස් තත්ත්වයක පවතින බව සඳහන් කළ හැකිය.

**2.3.2 සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව අනුබද්ධ ආයතන හරහා සිදුකළ කාර්යයන්**

**2.3.2.1 ජෝන් ද සිල්වා සමරු රඟහල**

ජෝන් ද සිල්වා සමරු රඟහලේ ඉදිකිරීමේ කාර්යයන් 2022 වසර  අවසානය වන විට ද පැවති බැවින් එහි ආදායම් උත්පාදන කාර්යය සිදුකිරීමට අවකාශ නොවීය.

**2.3.2.2 එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය පුහුණු හා පර්යේෂණ ආයතනය**

| අනු අංකය | වැඩසටහන | වියදම |
|---|---|---|
| 1. | රංගාවතරණ නාට්‍ය වැඩමුළුව | 156,800.00 |
| 2. | නාට්‍ය හා රංගකලා සිසුන්ට පොත් බෙදා දීම | 57,000.00 |
| එකතුව | | 213,800.00 |

| අනු අංකය | වැඩසටහන | වෙන්කිරීම් ගණන | ආදායම |
|---|---|---|---|
| 1. | එදිරිවීර සරච්නාට්‍ය පාසල වෙන් කිරීමෙන් ලද ආදායම | 94 | 212,650.00 |

**2.3.2.3 ජන සංගීත සංරක්ෂණ මධ්‍යස්ථානය**

| අනු අංකය | වැඩසටහන | වියදම |
|---|---|---|
| 1. | අස්පර්ශනීය උරුම ග්‍රන්ථ 3ක් එළි දැක්වීම | 65,590.00 |
| 2. | අස්පර්ශනීය උරුම වැඩමුළුව | 55,000.00 |
| 3. | ශාන්තිකර්ම සන්නිවේදනය පිළිබඳ සංකථන වැඩසටහන | 77,000.00 |
| එකතුව | | 197,590.00 |

**2.3.2.4 වලිසිංහ හරිස්චන්ද්‍ර සංස්කෘතික කේන්ද්‍රය**

| අනු අංකය | වැඩසටහන | වියදම |
|---|---|---|
| 1. | වලිසිංහ හරිස්චන්ද්‍ර ගුවන්විදුලි වැඩසටහන | 18,000.00 |
| 2. | මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | 22,000.00 |
| එකතුව | | 40,000.00 |

**2.3.2.5 උතුරු දකුණු මිතුරු සෙවන සංස්කෘතික කේන්ද්‍රය**

| අනු අංකය | වැඩසටහන | වියදම |
|---|---|---|
| 1. | වසුන්දරා මුද්‍රා නාට්‍ය රඟදැක්වීම | 150,000.00 |
| එකතුව | | 150,000.00 |

**2.3.2.6 දොළොස්මහේ පහන වැඩසටහන - ප්‍රාදේශීය ලේකම් කාර්යාල 334**

| අනු අංකය | වැඩසටහන | ලබාදුන් ප්‍රතිපාදන රු. |
|---|---|---|
| 1. | ජනවාරි මාර්තු - දොළොස්මහේ පහන | 2,004,000.00 |
| 2. | අප්‍රේල් - ජූනි - දොළොස්මහේ පහන | 1,995,890.00 |
| 3. | ජූලි - සැප්තැම්බර් - දොළොස්මහේ පහන | 1,920,500.00 |
| 4. | ඔක්තෝබර් - දෙසැම්බර් - දොළොස්මහේ පහන | 2,010,000.00 (335) |
| එකතුව | | 7,930,390.00 |

**2.3.2.7 දොළොස්මහේ පහන වැඩසටහන - දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 (ප්‍රතිපාදන යැවීම 26කි)**

| අනු අංකය | වැඩසටහන | ලබාදුන් ප්‍රතිපාදන රු. |
|---|---|---|
| 1. | ජනවාරි මාර්තු - දොළොස්මහේ පහන | 156,000.00 |
| 2. | අප්‍රේල් - ජූනි - දොළොස්මහේ පහන | 156,000.00 |
| 3. | ජූලි - සැප්තැම්බර් - දොළොස්මහේ පහන | 149,500.00 |
| 4. | ඔක්තෝබර් - දෙසැම්බර් - දොළොස්මහේ පහන | 156,000.00 |
| එකතුව | | 617,500.00 |

**2.3.2.8 සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය**

| අනු අංකය | ව්‍යාපෘතිය | ප්‍රතිපාදිත මුදල | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1. | කුණ්ඩසාලයේ ජාතික කලා නිකේතනය | රු.මි 10 | අවුරා ඇත | 93% |
| 2. | මිහින්තලය උතුරු දකුණු මිතුරු සෙවන | රු.මි 03 | රු 2,924,421.00 | 97% |

### 2.3.3 සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව අනුබද්ධ ආයතන හරහා සිදුකළ කාර්යයන් 11 (ආදායම)

#### 2.3.3. 1 එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය පුහුණු පාසල

| අනු අංකය | කාරණය | වෙන්කිරීම් ගණන | ආදායම |
|---|---|---|---|
| 1. | එදිරිවීර සරච්චන්ද්‍රනාට්‍ය පාසල වෙන් කිරීමෙන් ලද ආදායම | 94 | 212,650.00 |

#### 2.3.3. 2 කුණ්ඩසාලයේ ජාතික කලා නිකේතනය

| අනු අංකය | කාරණය | වෙන්කිරීම් ගණන | ආදායම |
|---|---|---|---|
| 1. | වෙන් කිරීමෙන් ලද ආදායම | 138 | 2,151,350.00 |

#### 2.3.3. 3 නිදහස් මන්දිරය

| අනු අංකය | කාරණය | වෙන්කිරීම් ගණන | ආදායම |
|---|---|---|---|
| 1. | වෙන් කිරීමෙන් ලද ආදායම | 107 | 613,000.00 |

#### 2.3.3. 4 රාජ්‍ය නර්තන කණ්ඩායම

| අනු අංකය | කාරණය | ගෙවීමේ පදනම මත වෙන්කිරීම් ගණන | ගෙවීමේ පදනම මත ලද ආදායම |
|---|---|---|---|
| 1. | වෙන් කිරීමෙන් ලද ආදායම | 4 | 189,500.00 |

#### 2.3.3. 5 පොත් අළෙවිසැලෙන් ලද ආදායම

| අනු අංකය | කාරණය | කාලය | ආදායම |
|---|---|---|---|
| 1. | පොත් අලවිය | මාස 12ක | 1,608,325.00 |

## 2.4 අභියෝග හා ඉදිරි ඉලක්ක

### 2.4.1 ඉලක්ක

කලාකරුවන් වෙනුවෙන්

- කලාකරුවන්ගේ ජීවන මට්ටම ඉහල නැංවීම
- කලාකරුවන්ට සම අවස්ථා ලබා දීම

කලා නිර්මාණ වෙනුවෙන්

- උසස් රසවින්දනයක් ඇති කිරීම සඳහා කලා නිර්මාණයන්හි ප්‍රමිතිය ඉහල නැංවීම
- සාම්ප්‍රදායික කලා නිර්මාණ ජනගත කිරීම

කලා ආයතන වෙනුවෙන්

- ප්‍රශස්ත සේවාව
- දීප ව්‍යාප්ත සේවාව

කලා සංගම් වෙනුවෙන්

- ප්‍රශස්ත සේවාව
- දීප ව්‍යාප්ත සේවාව

නිලධාරීන් වෙනුවෙන්

- වගකීමෙන් හා වගවීමෙන් ඵලදායීව කටයුතු කරන රාජ්‍ය සේවකයෙකු බිහිකිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම

මහජනතාව වෙනුවෙන්

- ශික්ෂාකාමී ජන සමාජයක් ගොඩනැඟීමට අවශ්‍ය පසුබිම සැකසීම
- උසස් රසවින්දනයක් ඇති කිරීමට කටයුතු කිරීම

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඉහත සඳහන් ඉලක්ක මුදුන්පත් කර ගැනීමේ කාර්යයන් දියත් කෙරෙන අතර ඒ අනුව

- කලාකරු සුබසාධන කාර්යයන් ඉටුකිරීම
- සම්මාන උළෙල හරහා කලාකරුවන් හා නිර්මාණ ඇගයීමට භාජනය කිරීම
- දොළොස්මගේ පහණ වැඩසටහන හරහා දිස්ත්‍රික් මට්ටම/ප්‍රාදේශීය මට්ටම හා ග්‍රාමීය මට්ටම දක්වා වැඩසටහන් දියත් කිරීම
- කලායතන ආධාර වැඩසටහන් හා කලායතන සඳහා විවිධ අවස්ථා සම්පාදනය කර දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ඵලදායිත්වය ඉහළ නැංවීම සඳහා කාර්යමණ්ඩල පුහුණු හා වැඩසටහන් දියත් කිරීම

සිදු කෙරෙන අතර එමගින් දෙපාර්තමේන්තු ඉලක්ක සපුරා ගැනීමට බලාපොරොත්තු වේ.

### 2.4.2 අභියෝග

- පැවති සංචරණ සීමා පැනවීම සහ සමාජ උද්ඝෝෂණ තත්ත්වය හේතුවෙන් ජනතාව ඒකරාශි කිරීමේ ගැටලු කාරී තත්ත්වයන් උද්ගත වූ බැවින් රාජ්‍ය සම්මාන උළෙල කිහිපයක් සිදු කිරීමට නොහැකි වූ අතර අදාළ උළෙල 2022 වසරේදී සිදුකිරීමට අවශ්‍ය වූ නමුත් ඒ සඳහා ප්‍රතිපාදන නොමැතිවීම
- දොළොස්මහේ පහන වැඩසටහන හරහා ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටම දක්වා වැඩසටහන් දියත් කිරීමට සීමිත ප්‍රතිපාදන ප්‍රමාණයක් ඇති බැවින් අදාළ වැඩසටහන් සිදුකිරීමේ දුෂ්කරතා පැන නැගුණු අතර දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන් මුල්‍ය පිරිවැය නොදරා සිදුකරන කාර්යයන් රැසක් දියත් කිරීමට ක්‍රියා කළහ. එවැනි කාර්යයන් හි දී සහභාගිත්වය ලබාදෙන කලාකරුවන් පාසල් සිසුන් හෝ කලායතන සිසුන්ට සංග්‍රහයක් ආදිය සිදු කිරීමේ ගැටලු ඇතිවන තත්ත්වයක සහ එම වැඩසටහන් ක්‍රියාවට නැංවීමේදී සම්පත් දායකයන්ට හෝ ඉහළ නිලධාරීන්ට සංග්‍රහයක් හෝ සිදු කරන්නට නොහැකිවන තත්ත්වයක බිම් මට්ටමේ ක්‍රියා කරන නිලධාරීන් අපහසුතාවන්ට ලක්විය.

- වසර අවසන් භාගය වන විට රටේ පැවති ආර්ථික අර්බුධ හමුවේ උත්සව සංවිධානය කිරීමේ සීමා පැනවීම හේතුවෙන් රාජ්‍ය උත්සව කිහිපයක් සිදු කිරීමට නොහැකිවිය. තත්ත්වය මෙසේ වුවද එක් එක් උත්සව පිළිබඳව බලාපොරොත්තු ඇතිව සිටි කලාකරුවන්, නිර්මාණකරුවන්, ආදි සම්මානයන්ට අයදුම්පත් හෝ නිර්මාණ ලබාදුන් පිරිස් විසින් නිරන්තරයෙන් ඒ පිළිබඳව විමසීම හා එම ගැටලුවලට සීමා සහිත පිළිතුරු සැපයීම අභියෝගයක් විය.

- සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අනුබද්ධ ආයතන වන නිදහස් මන්දිරය පවරා ගැනීම සහ ජන සංගීත සංරක්ෂණ මධ්‍යස්ථානය පවරා ගැනීම දෙපාර්තමේන්තුවට අභියෝගාත්මක තත්ත්වයක් විය. නිදහස් මන්දිරය එක් එක් නිර්මාණ ජනගත කිරීමට භාවිතා කළ අතර එවැනි කාර්යයන් ශාලා ගාස්තු මත සිදුකිරීමට සිදුවිය. එමෙන්ම දෙපාර්තමේන්තුවේ යූටියුබ් නාලිකාව සම්පාදනය කරමින් ජනසංගීත සංරක්ෂණ මධ්‍යස්ථානය මගින් පටිගත කළ සංරක්ෂිත දර්ශන ජනගත කිරීමේ පියවර ආරම්භ කිරීමත් සමග සහ එම සංරක්ෂිත දර්ශන සංස්කරණ කාර්යයන්ට පියවර ගැනීමත් සමග එම ආයතනය ද පවරා ගැනීම ඒ උදෙසා නිර්මාණය කල කාර්යයන් රැසකට බාධා පැමිණීමට හේතු විය. මීට අමතරව දෙපාර්තමේන්තුවට දත්ත (පරිගණක දත්ත වීඩියෝ සහ ඡායාරූපකරණය හා ඒවායේ සංරක්ෂණය) ආරක්ෂා කර ගැනීමට සර්වරයක් නොමැති වීමේ ගැටලුවට ද මුහුණ පාන්නට සිදුවිය.

- අරමුදල් සීමාවීමේ ගැටලුව ද මේ අතර දැඩිව බලපෑ ගැටලුවකි. කලාකරුවන්, කලායතන, කලා සංගම් ආදියෙන් මෙන්ම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා විවිධ වැඩසටහන් උත්සව මෙන්ම කලාකරු වෛද්‍යාධාර, මරණාධාර ආදිය සඳහා සුපුරුදු ඉල්ලීම් ඉදිරිපත් කරන අතර එම සුබසාධන සේවාව පවත්වාගෙන යාම ද බලපෑ ගැටලුවකි.

- ඉදිකිරීම් සහ නඩත්තු කාර්යයන් සඳහා ද අවශ්‍ය පරිදි ප්‍රතිපාදන නොමැතිකම තවද අභියෝගයන්ට මුහුණ පෑ අවස්ථාවන් විය. ජොන් ද සිල්වා සමරු රඟහල ඉදිකිරීම සම්බන්ධයෙන් නිරන්තරව කලාකරුවන් කරන විමසීමද අනුබද්ධ ආයතනවල අවශ්‍යතා ඉටුකර ගැනීමේ ඉල්ලීම් ඉටු කිරීමට තිබෙන ගැටලුව මෙන්ම සිංහල විශ්වකෝෂ කාර්යාලයට නිශ්චිත ස්ථානයක් සැපයීම සඳහා වූ ගැටලුව ද දෙපාර්තමේන්තුව මුහුණ පෑ අභියෝගයන්ය.

## 3 පරිච්ඡේදය 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මුල්‍ය කාර්ය සාධනය

### 3.1 මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
### 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලසීමාව සඳහා වන මුල්‍ය කාර්ය සාධනය

| අයවැය 2022 | | සටහන | 2022 | 2021 | |
|---|---|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | | | |
| | ආදායම් බදු | 1 | | | |
| | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | | | ඒ.සි.ඒ 1 |
| | අන්තර්ජාතික වෙළඳාම මත බදු | 3 | | | |
| | බදු නොවන ආදායම සහ වෙනත් | 4 | | | |
| | මුළු ආදායම් ලැබීම් (අ) | | | | |
| | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| | භාණ්ඩාගාර අග්‍රිම | | 602,657,000 | 932,965,000 | ඒ.සි.ඒ 3 |
| | තැන්පතු | | 1,354,955 | 9,669,005 | ඒ.සි.ඒ 4 |
| | අත්තිකාරම් ගිණුම් | | 22,923,556 | 25,182,321 | ඒ.සි.ඒ 5/5(අ) |
| | වෙනත් ලැබීම් | | | | |
| | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **626,935,511** | 967,816,325 | |
| | මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් (අ)+ (ආ)= (ඇ) | | **626,935,511** | 967,816,325 | |
| | **අඩුකලා වියදම** | | | | |
| | **පුනරාවර්තන වියදම** | | | | |
| | වේතන වැටුප් සහ අනෙක් සේවක ප්‍රතිලාභ | 5 | 469,781,331 | 401,846,669 | |
| | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 181,815,431 | 199,880,485 | |
| | සහනාධාර, සහනාධාර මාරු කිරීම | 7 | 58,948,981 | 61,530,261 | ඒ.සි.ඒ 2(11) |
| | පොලී ගෙවීම | 8 | | | |
| | වෙනත් පුනරාවර්තන | 9 | | | |
| | **මුළු පුනරාවර්තන වියදම (ඈ)** | | **710,545,743** | 663,257,415 | |
| | **මූලධන වියදම්** | | | | |
| | මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 32,912,584 | 70,731,204 | |
| | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 3,452,617 | 377,863,502 | |
| | ප්‍රාග්ධන මාරුකිරීම | 12 | | | |
| | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 13 | | | |
| | හැකියා වර්ධනය | 14 | 554,333 | 3,009,260 | |
| | වෙනත් මූලධන වත්කම් | 15 | | | |
| | **මුළු මූලධන වියදම (උ)** | | **36,919,534** | 451,603,966 | |
| | ප්‍රධාන ලෙජර් වියදම (උෟ) | | | | |
| | තැන්පතු ගෙවීම් | | 1,910,668 | 14,707,485 | ඒ.සි.ඒ 4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 22,361,117 | 14,559,054 | ඒ.සි.ඒ 5/5(අ) |
| | **ප්‍රධාන ලෙජර් වියදම (උෟ)** | | **24,271,785** | 29,266,539 | |
| | **මුළු වියදම ඌ=(උ+උෟ+ඊ)** | | 771,737,062 | **1,144,127,920** | |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය උෟ =(ඉ - ඒ)** | | (144,801,551) | (176,311,594) | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
## 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඊසීඒ-පී

ඒසීඒ-8

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තත්‍ය 2022 රු. | 2021 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 1,382,824,759 | 1,325,765,864 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 73,157,270 | 73,719,709 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **1,455,982,029** | **1,399,485,573** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 58,927,196 | 58,933,923 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,382,824,759 | 1,325,765,864 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 14,230,074 | 14,785,786 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **1,455,982,029** | **1,399,485,573** |

පිටු අංක.....සිට ..... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ..... සිට ..... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ..... | ..... | ..... |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 28/02/2023 | දිනය : 28/02/2023 | දිනය : 28/02/2023 |

භාග්‍යා සී. කටුදෙණිය
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ (වැ.බ)
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
"සෙත්සිරිපාය"
බත්තරමුල්ල. 2

බී. ආර්. රණසිංහ
ගණකාධිකාරී (වැ.බ.)
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
8 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| අයවැය 2022 රු. | | සටහන | තත්‍ය 2022 රු. | 2021 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | පාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 602,657,000 | 932,965,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 1,354,955 | 9,669,005 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 22,923,556 | 25,182,321 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | | - | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 626,935,511 | 967,816,325 | |
| 206 | 206-2-3-13-1409-0/11 | කලායතන සඳහා ආධාර | 259 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ | | | 301,000.00 | |
| 206 | 206-2-3-13-1409-0/11 | කලායතන සඳහා ආධාර | 260 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නුවරඑළිය | | | 160,500.00 | |
| 206 | 206-2-3-13-1409-0/11 | කලායතන සඳහා ආධාර | 262 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර | | | 454,384.00 | |
| 206 | 206-2-3-13-1409-0/11 | කලායතන සඳහා ආධාර | 263 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට | | | 466,465.00 | |
| 206 | 206-2-3-13-1409-0/11 | කලායතන සඳහා ආධාර | 264 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - යාපනය | | | 166,500.00 | |
| 206 | 206-2-3-13-1409-0/11 | කලායතන සඳහා ආධාර | 266 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - වව්නියාව | | | 31,000.00 | |
| 206 | 206-2-3-13-1409-0/11 | කලායතන සඳහා ආධාර | 268 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කිළිනොච්චි | | | 18,000.00 | |
| 206 | 206-2-3-13-1409-0/11 | කලායතන සඳහා ආධාර | 269 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මඩකළපුව | | | 33,000.00 | |
| 206 | 206-2-3-13-1409-0/11 | කලායතන සඳහා ආධාර | 270 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -අම්පාර | | | 185,500.00 | |
| 206 | 206-2-3-13-1409-0/11 | කලායතන සඳහා ආධාර | 271 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -ත්‍රිකුණාමළය | | | 18,000.00 | |
| 206 | 206-2-3-13-1409-0/11 | කලායතන සඳහා ආධාර | 273 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුත්තලම | | | 125,500.00 | |
| 206 | 206-2-3-13-1409-0/11 | කලායතන සඳහා ආධාර | 276 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල | | | 242,650.00 | |
| 206 | 206-2-3-13-1409-0/11 | කලායතන සඳහා ආධාර | 277 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොනරාගල | | | 323,660.00 | |
| 206 | 206-2-3-13-1409-0/11 | කලායතන සඳහා ආධාර | 279 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල | 3,780,000.00 | | 362,465.00 | 90% |
| 206 | 206-2-3-14-1508-0/11 | මහාවංසය 5 වෙළුම (ඉංග්‍රීසි පරිවර්තනය) මුද්‍රණය | 211 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 528,758.50 | | 528,758.50 | 100% |
| 206 | 206-2-3-16-2001-0/11 | ජාතික කලාභවන නවීකරණ කටයුතු | 223 | ශ්‍රී ලංකා නාවික හමුදාව | 30,481,323.71 | | 30,382,894.28 | 100% |
| එකතුව | | | | | | | **114,211,130.60** | |

### 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | 825,088,668.00 | වලිසිංහ හරිස්චන්ද්‍ර කෞතුකාගාරය, කලාභවන, ශබ්දකෝෂය (නෛතික හා තක්සේරු කටයුතු කෙරෙමින් පවතී) | 70% |
| 9152<br>2.1<br>2.2 | යන්ත්‍රෝපකරණ<br>ප්‍රවාහන උපකරණ | | 80,875,034.90<br>71,500,000.00 | දෙපාර්තමේන්තු වාහන (නෛතික හා තක්සේරු කටයුතු සිදුකර ගිණුම් ගතකර ඇත) | 100% |
| 9153 | ඉඩම් | | 62,000,0000.00 | වලිසිංහ හරිස්චන්ද්‍ර කෞතුකාගාරය, කලාභවන, ශබ්දකෝෂය (නෛතික හා තක්සේරු කටයුතු කෙරෙමින් පවතී | 30% |
| 9154 | අස්පශ්‍ය වත්කම් | | 255,790.00 | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගන යන වැඩ | | 343,105,266,24 | | |
| 9180 | බදුදෙන ලද වත්කම් | | | | |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව



# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE



මගේ අංකය எனது இல. My No. } CAA/A/CULD/2022/07 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 මැයි 31 දින




අධ්‍යක්ෂ ජනරාල්,

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

ඉහත සඳහන් සම්පිණ්ඩන වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

එච්. එම්.රණසිංහ බණ්ඩා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත :- 1. සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව - සම්පිණ්ඩන වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන එවා ඇත.

2. ලේකම් - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

Ms. Himali
05/31

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය
எனது இல.
My No. CAA/A/CULD/2022/07

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 මැයි 09 දින

අධ්‍යක්ෂ

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 206 - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---

ශීර්ෂය 206 - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා

තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 1.2.1 | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 8.2 ඡේදය ප්‍රකාරව තවදුරටත් වාර්තා කළයුතු මූල්‍ය නොවන වත්කම් තිබේ නම් ඒවා නිසි පරිදි හඳුනාගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනාගත නොහැකි නම් තක්සේරු කළ අගයට ගිණුම් ගත කළ යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතු ගොඩනැඟිලි 05 ක්, තක්සේරු අගය රු.5,000,000 ක් වූ වාහන 02ක් හා හෙක්ටයාර් 1.4157 ක් වූ ඉඩම් 04 | දෙපාර්තමේන්තුවට අයත් සියලු මූල්‍ය නොවන වත්කම් හඳුනාගත් පිරිවැය හෝ තක්සේරු වටිනාකම මත ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ක් 2022 දෙසැම්බර් 31 වන විටද ගිණුම්ගත කර නොතිබුණි. | |
| 1.2.2 (අ)(i) | 2022 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමෙහි හර ශේෂය සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව හර ශේෂය අතර රු.444,761 ක වෙනසක් පැවතුණු අතර 2004 වර්ෂයට පෙර සිට පැවත එන මෙම වෙනස හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | අත්තිකාරම් පාලන ගිණුම හා භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව ශේෂයේ වෙනසක් තිබේ නම් එම වෙනස හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| 3.2.4(iv) | වසර 03 ක කාල ප්‍රමාදයක් සහිතව ජෝන්ද සිල්වා සමරු රහහලේ I අදියරේ ඉදිකිරීම් කටයුතු සිදු කර ගොඩනැඟිල්ල භාර දී තිබුණද ප්‍රමාද ගාස්තු ලෙස අයකරන ලද රු.38,658,734 ක මුදල නිසි අනුමැතියකින් හා සාධාරණ කරුණු තහවුරු කර ගැනීමකින් තොරව නැවත කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.ඒ සඳහා නිසි අධිකාරී බලයකින් හා අනුමැතියකින් තොරව දෙවන අදියරේ ප්‍රතිපාදන මුදලින් රු.8,512,971 ක්ද වැය කර තිබුණි. | කොන්ත්‍රාත්කරු වෙත නැවත ගෙවූ ප්‍රමාද ගාස්තු ආපසු අයකර ගැනීමට පියවර ගත යුතුය. |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

---

**1.6.1.1 මූල්‍ය නොවන වත්කම්**

---

එකතුව රු.1,210,000 කට තක්සේරු කරන ලද වාහන 02 ක වටිනාකම රු.210,000 ක් අඩුවෙන් රු.1,000,000 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

**1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ණය (සිසි -10 )ලේඛනය | - | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඇප තැන්පතු ලේඛනය | මුදල් රෙගුලාසි සංග්‍රහයේ 880 සිට 893 දක්වා හා රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වැනි අධිකාරිය | පවත්වා නොතිබුණි. |
| (ඇ) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 211(1) සහ 447 | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ඈ) | වැය ලෙජරය | මුදල් රෙගුලාසි 447 (3) | විධිමත්ව පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙන් කලාභූෂණ සම්මාන උළෙල සඳහා රු.7,500,000 ප්‍රතිපාදන වෙන්කර තිබුණද එම උළෙල පවත්වා තිබුණු බවට හා වැය කර තිබුණු මුදල සම්බන්ධයෙන් කාර්ය සාධන වාර්තාවේ තොරතුරු අනාවරණය කර නොතිබුණි.

(ආ) එකම කාර්යක් වෙනුවෙන් වැය විෂයයන් කීපයක් යටතේ මුදල් වෙන් කර වියදම් කළ අවස්ථා විය.

(i) කලායතන ආධාර සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් 206-2-3-3-1508 වැය විෂයය යටතේ රු.6,000,000 ක් වෙන්කර තිබියදී මිල කල නොහැකි උරුමයන් ප්‍රවර්ධනය හා සංරක්ෂණය - 206-2-3-12-1409 වැය විෂයය යටතේද රු.800,000ක් වෙන් කර තිබුණි.ප්‍රගති වාර්තාවලට අනුව ප්‍රතිපාදන මුදලින් රු.770,000ක් ඉතිරිව තිබුණුද කාර්ය සාධන වාර්තාවට අනුව ප්‍රතිපාදන මුදල ඉක්මවා රු.833,000ක් වැයකර තිබුණි.

(ii) ප්‍රාදේශීය සාහිත්‍ය උත්සව සඳහා 206-2-2-1-1409 වැය විෂයය යටතේ රු.2,500,000 ක් ද 206-2-3-12-1409 වැය විෂය යටතේ රු.1,000,000ක් හා 206-2-2-2-1409 වැය විෂයය යටතේ රු.8,375,000 ක් වෙන්කර තිබුණි.මීට අදාලව වැය කරන ලද මුදල ප්‍රගති වාර්තාවල හෝ කාර්යසාධන වාර්තාවේ දක්වා නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික් සංස්කෘතික කටයුතු යටතේ දොළොස්මහේ පහන වැඩසටහන වෙනුවෙන් රු.4,000,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු ද කාර්තුමය ප්‍රගති වාර්තාවට අනුව මෙම වැඩසටහන වෙනුවෙන් රු.617,500 ක ප්‍රතිපාදන පමණක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 වෙත යවා ඇති බව සඳහන් ව තිබුණි.කෙටුම්පත් කාර්ය සාධන වාර්තාවට අනුව එකතුව රු.867,500 ක මුදලක් ලබා දී තිබීම හේතුවෙන් කාර්තුමය ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් මුදලට වඩා රු.250,000 ක් වැඩිපුර ප්‍රතිපාදන ලබා දී තිබුණි.

(ඇ) කෙටි චිත්‍රපට උළෙල සඳහා ඇස්තමේන්තුගත වියදම ඉක්මවා අයිතම් 05 ක් වෙනුවෙන් එකතුව රු.381,241 ක් වැඩියෙන් වැයකර තිබුණි.

(ඉ) **ඇම්බර්සර්ඩර්ස් ඊව් (Ambassadors eve) සංස්කෘතික ප්‍රසංගය**

(i) වියදම් ඇස්තමේන්තුවක් සකස් කිරීමකින් තොරව හා ලිඛිත අනුමැතියක් නොමැතිව රාජ්‍ය නැටුම් හා සංගීත කණ්ඩායම් සඳහා වූ වැය විෂය අංක 206-2-3-5-1508 න් එකතුව රු.298,620 ක මුදලක් ඇම්බර්සර්ඩර්ස් ඊව් (Ambassadors eve) සංස්කෘතික ප්‍රසංගය සඳහා ගෙවා තිබුණි.

(ii) දෙපාර්තමේන්තුව සතුව ඇති නාට්‍ය පාසල ප්‍රයෝජනයට නොගෙන දින 14 ක් සඳහා රු.55,200 ක මුදලක් ගෙවා බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ ශාලා පහසුකම් ලබාගෙන තිබුණි.

(iii) දෙපාර්තමේන්තුව තුළ නැටුම් ශිල්පීන් 47 දෙනෙකුගෙන් සමන්විත නැටුම් කණ්ඩායමක් සිටියදීත් බාහිර නැටුම් ශිල්පීන් 28 දෙනෙකු සඳහා රු.285,000 ක් ගෙවා තිබුණි.

(iv) පිළිගැනීමේ නර්තනය ප්‍රසංගයෙන් ඉවත් කිරීම නිසා එම නර්තනය පුහුණුවීම සඳහා ගෙවා තිබුණු රු.29,000 වියදම අනාර්ථික පිරිවැයක් ලෙස නිරීක්ෂණය විය.

**2.1.1 අරමුණුගත නොවන වියදම්**

---

(අ) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අරමුණුගත නොවන එසේම ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින එම අමාත්‍යාංශයේ අරමුණු යටතට වැටෙන ගුවන් විදුලි රාජ්‍ය සම්මාන උළෙල සඳහා 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා එකතුව රු.27,763,542 ක් දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි.

(ආ) ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අරමුණු යටතට වැටෙන රූපවාහිනී රාජ්‍ය සම්මාන උළෙල සඳහාද 2022 වර්ෂයේ දී රු.4,000,000 ක් වෙන්කර තිබුණි.

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

---

සමාලෝචිත වර්ෂයේ බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය අනුව වැය විෂයයන් 05 කට අදාලව එකතුව රු.2,275,864 ක ශේෂයක් දක්වා තිබුණද එකී බැරකම්වලට අමතරව 2023 ජනවාරි හා පෙබරවාරි මාසයන්හි 2022 වර්ෂයට අදාලව වැය විෂයයන් 10 ක් යටතේ එකතුව රු.8,841,820 ක් ගෙවා තිබුණි. මේ අනුව මූල්‍ය ප්‍රකාශනවල බැඳීම් හා බැරකම් රු.6,565,956 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**2.3 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතික වීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

**2.4. නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදය** | |
| (i) 4.2, 4.5, 4.6 හා 6.3 උපවගන්තිය | වර්ෂ 05 ඉක්මවූ මියගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.23,931 ක්වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 4.5 උපවගන්තිය හා 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PFD/RED/2015/08 පොදු(i) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3(ඉ) ඡේදය | වසර 05 ක කාලය ඉක්මවා ඇති වැඩ තහනම් කල නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.36,380 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | 4.5, 4.6 උපවගන්ති හා 2019 ජුනි 27 දිනැති අංක 5/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3(ඉ) හා 4 ඡේදය | වසර 05 ක කාලය ඉක්මවා ඇති සේවය හැරගිය නිලධාරීන් 13 දෙනෙකුගෙන් අයවිය යුතු රු.204,039 ක්වූ ණය ශේෂ හා හඳුනා නොගත් නිලධාරීන් 6 දෙනෙකුගෙන් අයවිය යුතු රු.23,923 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදය | වසර 05 ක් ඉක්මවා ඇති රජයේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය සේවකයින් 23 දෙනෙකුට අදාල රු.90,568 ක් වූ ණයශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**2.5 බැංකු ගිණුම් මෙහෙයවීම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 වර්ෂයට පෙර වර්ෂයන්ට අදාලව රු.19,351 ක් වටිනා චෙක්පත් 06 ක් හා 2014 වර්ෂයේ සිට බැංකු සැසඳුමෙහි වෙනස්කම් ලෙස දක්වා තිබුණු එකතුව රු.3,040 ක් වූ ශේෂ 02 ක් හඳුනා නොගත් ගෙවීම් ලෙස දිගින් දිගටම දක්වා තිබුණු අතර හඳුනා ගෙන ගැලපීම් කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් දක්වා කාලය තුල බැංකු සැසඳුම් ප්‍රකාශ පිලියෙල කිරීමේදී හඳුනානොගත් ගෙවීම් ලෙස සටහන් කර තිබුණු ශේෂයන් 29ක එකතුව වූ රු.810,606 ක වටිනාකම හඳුනා ගැනීමට කටයුතු නොකර මුදල් පොතේ ශේෂයන් අඩුකරමින් සංශෝධිත මුදල් ශේෂය ගණනය කර තිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

#### 3.1.1 සැලැසුම් කිරීම

2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, එම ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් වැය විෂය යටතේ සිදු කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් දැක්වීමේදී එම ක්‍රියාකාරකම් යටතේ වූ භෞතික ඉලක්ක දක්වා නොතිබුණි.

**3.1.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රවර්ථන වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙන් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණද වැය විෂයන් දෙකකින් එකතුව රු.6,312,890 ක ප්‍රතිපාදන දොළොස්මහේ පහන වැඩසටහන සඳහා ලබා දී තිබුණු බව කාර්තුමය ප්‍රගති වාර්තාවල සඳහන් කර තිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙන් ප්‍රතිපාදන වෙන් නොකරන ලද හුස්මක් ප්‍රසංගය වෙනුවෙන් රු.2,825,642 ක් වැය කර තිබුණි.

**3.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

---

ලේඛකාධාර ව්‍යාපෘතිය යටතේ 2022 වසරේ තෝරාගත් පොත් මිලදී ගැනීම සඳහා රු.4,300,000 ක මුදලක් වැය කර තිබු අතර භාෂා 03 න් පොත් 10,313 ක් මිලදීගෙන තිබුණද මිලදී ගත් පොත් වලින් වර්ෂය තුල 8,949 ක් බෙදාහැර නොතිබුණි.ඊට අමතරව 2018 වර්ෂයට පෙර සිට 2021 වර්ෂය දක්වා මිලදී ගත් පොත් 6,914 ක් 2022 දෙසැම්බර් 31 දින වන විට බෙදා නොහැර ගබඩාව තුල පැවතුණි.

**3.1.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

---

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්යසාධන දර්ශක 5ක් හා එහි ළඟාකරගැනීම් ප්‍රතිශතය කාර්යසාධන වාර්තාවේ දක්වා තිබුණ ද, කාර්යසාධන දර්ශක හා එහි අපේක්ෂිත ඉලක්ක ප්‍රමාණය ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර නොතිබුණු බැවින් කාර්යසාධනය ළඟාකරගැනීමට දෙපාර්තමේන්තුව සමත්වුයේද යන්න තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) නිරසාර අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය යටතේ එක් අරමුණක් හා ඉලක්කයක් ද එය සපුරාගැනීමේ කාර්යසාධනය 75% - 100% අතර වන බවද දක්වා තිබුණද මීට අදාළ අරමුණු, ඉලක්ක හා දර්ශක ක්‍රියාකාරී සැලැසුමේ දක්වා නොතිබූ බැවින් සපුරාගැනීමේ කාර්යසාධනය සම්බන්ධව විගණනයට තහවුරු කරගත නොහැකි විය.

(ඇ) මූල්‍ය නොවන වත්කම් ලෙස රු.1,382,824,759ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද කාර්යසාධන වාර්තාවේ මූල්‍ය නොවන වක්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය යටතේ අදාල වත්කම්වල අගය ලෙස රු. 958,588,668ක් එනම් රු. 424,236,091ක් අඩුවෙන් වාර්තා කර තිබුණි. තවද, සියයට 30 – 100ත් අතර ප්‍රතිශතයක් ලෙස දැක්වුණු වාර්තා කිරීමේ ප්‍රගතිය නිවැරදි නොවන බවද නිරීක්ෂණය විය.

(ඇ) කාර්යසාධන වාර්තාවෙහි ඇතුලත් අනුකූලතා වාර්තාවේ සඳහන් අයිතම 4ක් අනුකූල වන බවට දක්වා තිබුණ ද එම තොරතුරු සාවද්‍ය බව විගණනයේදී නිරීක්ෂණය විය.

**3.2 ප්‍රසම්පාදනයන්**

---

**ජෝන්ද සිල්වා සමරු රඟහල අලුත්වැඩියා කිරීම (වැය විෂය 206-2-3-15-2104)**

(අ) 2022 වර්ෂයේ සංශෝධිත අයවැය ඇස්තමේන්තුව මගින් වෙන්කර තිබුණු රු.75,800,000 ක් ප්‍රතිපාදනය ජෝන්ද සිල්වා රඟහල දෙවන අදියරේ තවදුරටත් නිම කිරීමට ඇති කටයුතු සඳහා වැය කිරීමට ලබා දී තිබුණි. එසේ වුවද එම අලුත්වැඩියා කටයුතු සිදුකළ බවට කාර්තුමය ප්‍රගති වාර්තාවල හෝ කෙටුම්පත් කාර්ය සාධන වාර්තාවේ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මේ වන විට මුළු කොන්ත්‍රාත් මුදලින් 20% ක් වන රු.මිලියන 311 ක් අත්තිකරම් ලෙස ගෙවා තිබුණද දැනට නිමකර ඇති ඉදිකිරීම් ප්‍රමාණය රු.මිලියන 86 ක් පමණක් බව අනාවරණය විය.

(ඇ) මෙම ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 09 වන විට නිමකර බාර දීමට කටයුතු කළ යුතු වුවත් 2023 වර්ෂයේ අප්‍රේල් වන විටත් අලුත්වැඩියා කටයුතු නිම කිරීමට අදාළ කොන්ත්‍රාත්කරු පියවර ගෙන නොතිබුණි.

(ඈ) ඒ අනුව කොන්ත්‍රාත්කරු ලබාගත් අත්තිකරම් මුදල ආවරණය කර නොමැති පසුබිමක දෙපාර්තමේන්තුව විසින් ඒ වෙනුවෙන් ගෙන තිබුණු පියවර විගණනයට අනාවරණය නොවුණි.

(ඉ) ගිවිසුම්ගත කාලය තුළ නවීකරණය කටයුතු නිම නොකිරීම නිසා නාට්‍යකරුවන් විශාල පිරිසකට ඔවුන්ගේ පුහුණුවීම් කටයුතු සිදුකිරීමට නොහැකි වීම,නාට්‍ය පැවැත්වීමට නොහැකිවීම නිසා ආදායම් ඉපැයීමේ කටයුතු ඇනහිටීමත් හේතුවෙන් රජයේ ආදායමද අහිමි වී තිබීම විශාල පාඩුවක් ලෙස විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

**3.3 වත්කම් කළමනාකරණය**

---

දෙපාර්තමේන්තුව සතු හෙක්ටයාර් 1.4157 ක් වූ ඉඩම් 04ක හිමිකම් සනාථ කිරීම සඳහා ලේඛන දෙපාර්තමේන්තුව සතුව නොපැවතුණු අතර ඉඩම් වල අයිතිය පවරා ගැනීමට පියවර ගෙන ද නොතිබුණි.

**3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම**

---

මුදල් රෙගුලාසි 880 සිට 893 දක්වාවූ රෙගුලාසි හා 612 වැනි අධිකාරිය මතවූ රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් 52 ක් ඉකුත් වසරේ හඳුනාගෙන තිබුණද එම නිලධාරීන් වෙතින් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4. යහපාලනය**

---

**4.1 අභ්‍යන්තර විගණනය**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර 2011 වර්ෂයේ අනුමත කරන ලද අභ්‍යන්තර විගණක තනතුර පිරවීමට 2023 මැයි මස වන විටත් කටයුතු කර නොතිබුණි.

**5. මානව සම්පත් කළමනාකරණය**

---

සමාලෝචිත වර්ෂයේ අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදි විය.

| සේවා මට්ටම | අනුමත ප්‍රමාණය | තථ්‍ය ප්‍රමාණය | පුරප්පාඩු ප්‍රමාණය |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 28 | 13 | 15 |
| තෘතීය මට්ටම | 04 | 01 | 03 |
| ද්විතීය මට්ටම | 629 | 584 | 45 |
| ප්‍රාථමික මට්ටම | 191 | 143 | 48 |
| **එකතුව** | **852** | **741** | **111** |

දෙපාර්තමේන්තුවේ 28ක් වූ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලයෙන් 15 ක් එනම් සියයට 54 ක පුරප්පාඩු පැවතුණි. වසර ගණනාවක සිට පුරප්පාඩු වී පවතින ගණකාධිකාරී තනතුර ද, මේ තුළ විය.

**04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය**

ආයතනයේ කාර්යසාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශකය | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| රාජ්‍ය සම්මාන උළෙල, ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා සිදු කරන සමස්ථ වියදම, ඒක පුද්ගල වියදම හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | √ | |
| කලාකරුවන්ගේ ජීවන මට්ටම උසස් කිරීම සඳහා සුභසාධන කටයුතු සිදු කිරීමේ දී දරන සමස්ථ වියදම, ඒක පුද්ගල වියදම හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව | √ | | |
| දිස්ත්‍රික් සංස්කෘතික කටයුතු සඳහා සිදු කරන සමස්ථ වියදම, ඒක පුද්ගල වියදම හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව | √ | | |
| අස්පර්ෂීය උරුම ව්‍යාප්තිකරණය හා ප්‍රවර්ධනය උදෙසා භෞතික සම්පත් සංවර්ධනය උදෙසා සිදුකරන සමස්ථ වියදම, ඒක පුද්ගල වියදම හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව | √ | | |
| සංරක්ෂණ කාර්යයන් සඳහා සිදුකරන සමස්ථ වියදම, ඒකකයක වියදම, ඒක පුද්ගල වියදම, නිර්මාණ සංඛ්‍යාව හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව | √ | | |

**05.පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය**

**5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.**

| ඉලක්කය/අරමුණ | ඉලක්කය | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% – 74% | 75% - 100% |
| නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | ලෝකයේ ස්වාභාවික හා සංස්කෘතික උරුමයන් රැකගැනීම හා ආරක්ෂා කරගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම | උරුමයේ ආකාරය අනුව සියලු සංස්කෘතික උරුමයන් රැකගැනීම, ආරක්ෂාව සහ සංරක්ෂණය වෙනුවෙන් සිදු කරන සමස්ත ඒක පුද්ගල වියදම | | | √ |

**5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.**

- රාජ්‍ය සම්මාන උළෙල, ව්‍යාපෘති හා වැඩසටහන් යටතේ, - 2022 වර්ෂය තුළ සම්මාන උළෙල 05 ක් පැවැත්වීම (රාජ්‍ය ගුවන්විදුලි සම්මාන උළෙල, රාජ්‍ය අස්පර්ශනීය උරුම සම්මාන උළෙල, රාජ්‍ය නාට්‍ය සම්මාන උළෙල, රාජ්‍ය සාහිත්‍ය උළෙල හා රාජ්‍ය කෙටි චිත්‍රපට සම්මාන උලෙළ)

මෙහිදී ප්‍රශස්ත නිර්මාණකරුවන්ට එක් එක් කලා ක්ෂේත්‍රයන්හි සුවිශේෂ මෙහෙවරක් සිදුකළ කලාකරුවන්ට හා විද්වතුන්ට සුවිශේෂ ඇගයීමක් වූ අතර රාජ්‍ය සම්මානයට පාත්‍රවීම තුළ ඔවුන් අභිප්‍රේරණය වීම සිදුවිය. එමෙන්ම රාජ්‍ය සම්මානයෙන් පිදුම් ලැබූ නිර්මාණාදිය සුභාවිත නිර්මාණ වශයෙන් සමාජගත වීම සිදුවූ අතර මෙමගින් නවක නිර්මාණකරුවන්ට ස්වකීය නිර්මාණකරණයේදී ආදර්ශයක් ලබාගත හැකි නිර්මාණ සමුච්චයක් ජනගත වීම සිදුවිය.

- කලාකරුවන්ගේ ජීවන මට්ටම උසස් කිරීම සඳහා සුභසාධන කටයුතු සිදු කිරීම යටතේ - කලාකරු හැදුනුම්පත් 297 ක් නිකුත් කිරීම, වෛද්‍ය ආධාර කලාකරුවන් 158 දෙනෙකු උදෙසා ලබාදීම, අගහිඟ කලාකරු ආධාර 3121 දෙදෙකු සඳහා ලබාදීම, කලායතන ආධාර 1298 ලබාදීම, පෙරහැර ආධාර 04 ක් ලබාදීම, අවමංගල ආධාර 90 දෙනෙකු සඳහා ලබාදීම, විවිධ උත්සව ආධාර 12 ක් ලබාදීම සංස්කෘතික සංගම් හා කලායතන ලියාපදිංචි වීම් 12 ක් සිදු කිරීම, කලාකරු සුවදම් ජාතික මට්ටමේ 01 ක් හා ප්‍රාදේශීය මට්ටමේ 335 සිදුකිරීම, රාජ්‍ය සංගීත කණ්ඩායම විසින් ප්‍රසංග 20 පැවැත්වීම, රාජ්‍ය නර්තන කණඩායම විසින් ප්‍රසංග 51 ක් සිදු කිරීම සිදුවිය

- දිස්ත්‍රික් සංස්කෘතික කටයුතු යටතේ- දොලොස්මහේ පහන වැඩසටහන දිස්ත්‍රික් මට්ටමින් සහ ප්‍රාදේශය මට්ටමින් සිදු කිරීම, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය වශයෙන් සාහිත්‍ය උත්සව සඳහා ප්‍රතිපාදන ලබාදීම සිදුවූ අතර එක් එක් කාර්තුවට අදාළ ප්‍රතිපාදන ලබාදෙමින් දොළොස්මහේ පහන වැඩසටහන ක්‍රියාවට නැංවීය

- අස්පර්ශීය උරුම ව්‍යාප්තිකරණය හා ප්‍රවර්ධනය උදෙසා භෞතික සම්පත් සංවර්ධනය යටතේ, - සුසැට කලා මංගල්‍ය ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට සමගාමීව සිදු කිරීම සහ රාජ්‍ය පොසොන් හේවිසි පූජාව සිදුකිරීම සිදුවිය.

- සංරක්ෂණ කාර්යයන් යටතේ - පටිගත කිරීම් සිදුකිරීම, ගුවන්විදුලි සම්මාන උළෙල සංරක්ෂණ කටයුතු, රාජ්‍ය නාට්‍ය උළෙල සංරක්ෂණ කටයුතු සිදුකිරීම. සිදුවිය

**අභියෝග**

- පැවති සමාජ වාතාවරණය හේතුවෙන් ඉලක්ක කරා යාමට සිදු කළ යුතු වැඩසටහන් වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන හිමි නොවීමත් රටේ පැවති ආර්ථික අර්බුදය හමුවේ උත්සව ආදිය සීමා කිරීමත් සිදුවූ බැවින් 2022 වසරේ සිදුකළ යුතුව තිබූ රාජ්‍ය උත්සව කිහිපයක් නතර කිරීමට සිදුවිය. එම සම්මාන උත්සවාදියේ ජයග්‍රහකයන් සහ ජයග්‍රහක නිර්මාණ ජනගත කිරීමට එබැවින් අවස්ථාවක් නොවීය.

**06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ**

**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂය සඳහා වන මානව සම්පත් සංවර්ධන සැලැස්ම**

1. සංවිධානය

1.1. අමාත්‍යංශය - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශය

1.2. දෙපාර්තමේන්තුව / නියෝජිතායතනය/ අංශය - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

2. සංවිධානයේ සැකැස්ම

2.1. දැක්ම

නිවුණු හැදුණු පිරුණු සොඳුරු මිනිසුන් සපිරි පින්බර දේශයක් එක්ව ගොඩනැගීම

2.2. මෙහෙවර

ශ්‍රී ලාංකීය අනන්‍යතාවයෙන් යුත් අස්පර්ශීය සංස්කෘතිය සංරක්ෂණය, ප්‍රවර්ධනය ව්‍යාප්තිකරණය සඳහා වූ වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම

2.3. අඟයන්

- අස්පර්ෂීය උරුම ව්‍යාප්තිකරණය හා ප්‍රවර්ධනය සඳහා රාජ්‍ය සම්මාන උළෙල, ව්‍යාපෘති හා වැඩසටහන්
- කලාකරුවන්ගේ ජීවන මට්ටම උසස් කිරීම සඳහා සිදු කරන සුභසාධනය
- උසස් රසවින්දනයක් ඇති කිරීම උදෙසා සිදු කරන දිස්ත්‍රික් සංස්කෘතික කටයුතු
- අස්පර්ශීය උරුම ව්‍යාප්තිකරණය හා ප්‍රවර්ධනය උදෙසා භෞතික සම්පත් සංවර්ධනය
- සියළුම කලා අංගයන්ගේ ශාස්ත්‍රානුකූල බව සුරැකීම සඳහා සිදු කරන සංරක්ෂණ කාර්යයන්

2.4. ඉලක්ක

කලාකරුවන් වෙනුවෙන්

- කලාකරුවන්ගේ ජීවන මට්ටම ඉහල නැංවීම
- කලාකරුවන්ට සම අවස්ථා ලබා දීම

කලා නිර්මාණ වෙනුවෙන්

- උසස් රසවින්දනයක් ඇති කිරීම සඳහා කලා නිර්මාණයන්හි ප්‍රමිතිය ඉහල නැංවීම
- සාම්ප්‍රදායික කලා නිර්මාණ ජනගත කිරීම

කලා ආයතන වෙනුවෙන්

- ප්‍රශස්ත සේවාව
- දීප ව්‍යාප්ත සේවාව

කලා සංගම් වෙනුවෙන්

- ප්‍රශස්ත සේවාව
- දීප ව්‍යාප්ත සේවාව

නිලධාරීන් වෙනුවෙන්

- වගකීමෙන් හා වගවීමෙන් ඵලදායීව කටයුතු කරන රාජ්‍ය සේවකයෙකු බිහිකිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම

මහජනතාව වෙනුවෙන්

- ශික්ෂාකාමී ජන සමාජයක් ගොඩනැඟීමට අවශ්‍ය පසුබිම සැකසීම
- උසස් රසවින්දනයක් ඇති කිරීමට කටයුතු කිරීම

2.5. දෙපාර්තමේන්තු අරමුණු

- ශ්‍රී ලාංකේය සංස්කෘතික පුරුෂාර්ථ හා ආචාර ධර්ම අනාගත පරපුරට දායාද කිරීම උදෙසා අස්පර්ෂ උරුමයන් සංරක්ෂණය
- සාම්ප්‍රදායික සංස්කෘතිකාංග හා අස්පර්ෂ උරුමයන් ආරක්ෂා කරමින් දේශීය අනන්‍යතාවය ප්‍රකටනය කිරීම උදෙසා අස්පර්ෂ උරුමයන් ප්‍රවර්ධනය
- සාරධර්ම සම්පන්න සමාජයක් ගොඩනැඟීම උදෙසා අස්පර්ෂ උරුමයන් ව්‍යාප්තිකරණය
- උසස් රසවින්දනයක් උදෙසා නිර්මාණ ප්‍රමිතිගත කිරීම
- කලාකරුවන්ගේ ජීවන මට්ටම උසස් කිරීම
- සියළු කලාංගයන් තුළ තිබෙන ශාස්ත්‍රානුකූල බව සුරැකීම

### 6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/අතිරික්ත |
|---|---|---|---|
| ජේෂ්ඨ | 28 | 13 | 15 |
| තෘතීයික | 04 | 01 | 03 |
| ද්විතියික | 629 | 584 | 45 |
| ප්‍රාථමික | 191 | 143 | 48 |

### 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසෙදැයි කෙටියෙන් සඳහන් කරන්න

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ඇතැම් තනතුරුවල  හිඟයක් හෝ අතිරික්තයක් ඇත. (උදා- සංවර්ධන නිලධාරී සේවයේ ඇතැම් දිස්ත්‍රික්කවල අතිරික්තයක් පවතින අතර උතුරු හා නැගෙනහිර පළාත තුල හිඟයක් පවතී. මේ අතර කළමණාකරණ සේවයේ හිඟයක් පවතී) මෙම හිඟය හෝ අතිරික්තය කාර්යසාධනයට යම් බලපෑමක් සිදුකරන බව පෙනේ. ඒ සදහා හිඟය හෝ අතිරික්තය තුළ අදාල කාර්යය ඉටුකිරීමට නිසි පුහුණුව ලද නිලධාරී නොමැතිවීම දැකිය හැකි ගැටලුවයි. මෙය පසුගිය වසරේ මෙන්ම 2022 වසරේද පැවති තත්ත්වයයි

මීට අමතරව පවත්නා තත්ත්වයට හා නූතන තාක්ෂණය සමග ක්‍රියාකරන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ හිඟයක් ඇති බව පෙනේ. උදාහරණයක් වශයෙන් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ශබ්දවාහිනී ක්‍රියාකරවීම සඳහන් කළ හැකිය. එය සංගීත ප්‍රසංගයකට සුදුසු පරිදි ශබ්ද සංකලනය කිරීමේ දැනුම දැනට සිටින කාර්යමණ්ඩලය වෙත ලබාදිය යුතු තත්ත්වයක් දැකිය හැකිය. මේ ගැටලුව නිසා බැහැරින් සේවා සපයා ගැනීමට සිදුව ඇති බව පෙනේ. මේ ආකාරයෙන් නිසි පුහුණුවක් භාවිතා කරන භාණ්ඩ සහ උපකරණ නවීකරණය වීමත් සමග ලබාදීම වැදගත් කොට සැලකිය යුතුව ඇත.

තවද තාක්ෂණය ලබාගැනීම හෝ ලබාදීම සම්බන්ධයෙන් දක්නට ලැබෙන ගැටලුවක් වන්නේ එම තාක්ෂණය භාවිතා කිරීමට ඇති ශක්‍යතා නොමැතිකමයි. මේ සඳහා උදාහරණයක් ලෙස පරිගණක සාක්ෂරතාව පෙන්වා දිය හැකි අතර පසුගිය සංචරණ සීමා පැනවීම් ආදියේදී නිවසේ සිට රාජකාරී කිරීමට ඇතැම් අවස්ථාවල සිදුවූ නිලධාරීන්ට ස්වකීය නිවෙස්වල පරිගණක යන්ත්‍ර, අන්තර්ජාල පහසුකම් ආදිය නොමැති කමින් එම කාර්යය සඳහා විවිධ බාධා වුල්ලවිය. ඒ අනුව ඔවුන් ලබාගත් තාක්ෂණික දැනුම භාවිත කිරීමට සුදුසු වාතාවරණයක් ඇති කිරීම ද මෙහිලා සැලකිල්ලට ගත යුතුව ඇත.

කොවිඩ් වසංගතයෙන් අනතුරුව පැවති සංචරණ සීමා සහ සමාජ ගැටලුකාරී වාතාවරණය හේතුවෙන් ද අවශ්‍ය පුහුණු සිදුකිරීමේ දුෂ්කරතා ද පැන නැගුණු අතර දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සැලසුමට අනුව අවශ්‍යතා හදුනාගනිමින් ඔවුන්ට නිසි පුහුණුවක් ලබාදීමට සැලසුම් කර ඇති අතර එතුළින් මෙම ගැටලු විසදා ගැනීමට හැකියාව ලැබෙනු ඇත

### 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු) | | වැඩසටහනේ ස්වභාවය(දේශීය/විදේශීය | නිමැවුම/ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| රාජ්‍ය | 60 | 2022.03.25 | 122,500 | නැත | දේශීය | රාජකාරී විෂය ක්ෂේත්‍රයට |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| නිලධාරීන් සඳහා වන දම්ල භාෂා පාඨමාලා | | සිට 2022.12.16 | | | | අවශ්‍ය භාෂා දැනුම ලබාදීමත් රාජකාරී කාර්යයන් සාර්ථක කර ගැනීමට එතුළින් හැකියාව ඇති නිලධාරීන් පිරිසක් ගොඩනැගීම |
| Auto Desk Architelure | 01 | 2022 .02.28 | 30,000 | නැත | දේශීය | රාජකාරී විෂය ක්ෂේත්‍රයට අදාළ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කාර්යයන් සාක්ෂාත් කර ගැනීමට හැකියාව ලබාදීම |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ පුහුණුව | 04 | 2022 .03,24 සහ 25 දෙදින | 40,000 | නැත | දේශීය | රාජකාරී විෂය ක්ෂේත්‍රයට අවශ්‍ය දැනුම සහ අදාළ ප්‍රමිතියට අනුව රාජකාරී සිදුකරන නිලධාරීන් පිරිසක් ගොඩනැගීම |

## 7. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 01 | පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබීම | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | - | | |
| 1.6 | වෙනත් | - | | |
| 02 | පොත්පත් හා ලේඛන නඩත්තුකිරීම (මු.රේ. 445) | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | | |
| | | | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 03 | මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රේ. 135) | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ හට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දැනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛනය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජ භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 04 | වාර්ෂික සැලසුම් සකස් කිරීම | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැකැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල නොවේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | | | |
| 05 | විගණන විමසුම | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු දී තිබීම | අනුකූල වේ | | |
| 06 | අභ්‍යන්තර විගණනය | | | |
| 6.1 | මු.රෙ 134(2) /1-2019 ට අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව | - | | |

| | | | | |
|---|---|---|---|---|
| | අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්ති ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාරතාවල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | - | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | - | | |
| 07 | විගණන හා කළමණාකරණ කමිටු | | | |
| 7.1 | Dඒ චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | - | | |
| 08 | වත්කම් කළමණාකරණය | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 09 | වාහන කළමණාකරණය | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | වෙත ඉදිරිපත් කිරීම | | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| 10 | බැංකු ගිණුම් කළමණාකරණය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | ප්‍රතිපාදන උපයෝජනය | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට වලඹීම | අනුකූල වේ | | |
| 12 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණයශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | | |
| 13 | පොදු තැන්පත් ගිණුම | | | |

| | | | | |
|---|---|---|---|---|
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | අග්‍රිම ගිණුම් | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල්පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | | |
| 15 | ආදායම් ගිණුම | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල වේ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම අදායමට බැර කර තිබීම. | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 16 | මානව සම්පත් කළමණාකරණය | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමෙන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | මහජනයා වෙත තොරතුරු ලබා දීම | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සපයා තිබීම. | | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 18 | පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19 | මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජියෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිවීබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | - අනුකූල වේ | | |
| 20 | විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම | | | |

| | | | | |
|---|---|---|---|---|
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |